# 2022 සැප්තැම්බර් මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

**ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2022.09.16**
**වේලාව - පෙ.ව. 10.00**

**පැමිණීම -**

| | | |
|---|---|---|
| I. | ඩබ්ලිව්.ජී. උපුල් මහතා | - ගරු සභාපති |
| II. | විදාන ගමගේ සුදත් මහතා | - ගරු උප සභාපති |
| III. | කේ.එච්. ගාමිණී මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | ඩබ්.කේ. ටෂිත සමිල මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | ඒ.පී. ධම්මික මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | ආර්.රජිත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | චතුමිණි විජේනායක මෙනවිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VIII. | ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IX. | එම්.එල්.එම්. හනීෆා මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| X. | ආර්.කේ.එම්. රෝහිත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XI. | පී.කේ. ආරියසේන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XII. | එන්.ජී. සරත් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIII. | වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIV. | චමින්ද ඩයස් වන්නිගේ මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XV. | ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVI. | වැල්ලගේ ජීවානි මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVII. | ඩබ්.කේ. සිසිර කුමාර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVIII. | ඒ.ඩබ්. නන්දා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |

**නොපැමිණීම -**

| | | |
|---|---|---|
| I. | එල්.එච්. කුමුදු සුජීව මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| II. | හර්ෂ උදය කුමාර ජයවීර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| III. | කපිල ඉන්ද්‍රජිත් ශ්‍රීවර්ධන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | ජී.එච්.ජී. නීටා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | පී.එල්. වාලි ගුණරත්න මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා පංචසීලය සමාදන් වීමෙන් අනතුරුව, රට වෙනුවෙන් දිවිපිදූ විරෝධාර රණවිරුවන්ට, ප්‍රාදේශීය සභාවේ ධූර කාලය දරා, මේ වන විට මිය ගොස් ඇති බුද්ධදාස ජයසූරිය මහතා ඇතුළු ගරු සභාපතිවරුන්ට, ගරු උප සභාපති ලෙස සිට මිය ගොස් ඇති ඩබ්.කේ. ප්‍රේමදාස මහතා හා අප සභාව නියෝජනය කළ ගරු සභික, එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාත්, ගරු සභිකවරුන් ඇතුළුව මියගිය සියලුම දෙනාට උපහාර දක්වමින්, විනාඩි දෙකක නිෂ්ශබ්දතාවය පළ කරන ලදී.

ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් 2022 වර්ෂයේ සැප්තැම්බර් මස මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්, ලේකම්තුමිය ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) (i) 2022.08.12 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.08.12 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා යෝජනා කරන ලදී. 2022.08.12 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු ප්‍රාදේශීය සභා සභික ඩබ්.කේ. ටෂිත සමිල මහතා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

**(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය -**

I. ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එල්. චාලි ගුණරත්න මහතා, එල්.එච්. කුමුදු සුජීව මහතා, ජී.එච්.ටී. නීටා මහත්මිය, හර්ෂ ජයවීර මහතා එවා ඇති නිවාඩු ලිපි නිවේදනය කරන ලදී.

ගරු සභික, එල්.එච්. කුමුදු සුජීව මහතා අද දින මහා සභාව සඳහා නිවාඩු ලිපියක් යොමු කර තිබුණද, ඔහු මීට පෙරත් දිගින් දිගටම මහා සභාවට කිසිදු දැනුම් දීමකින් තොරව නොපැමිණ ඇති නිසාත්, ඇතැම් අවස්ථාවල නිවාඩු ලිපි වැරදි අත්සනකින් යුතුව ඉදිරිපත් කර සභාව නොමග යැවීමට කටයුතු සිදු කර ඇති නිසාත්, ඔහුගේ නිවාඩු අනුමත කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත දන්වා යවා ඇති බැවින්, අද දින මහා සභාවේ ඔහුගේ නිවාඩු ලිපිය අනුමත කළ නොහැකි බවත්, පළාත් පාලන සහකාර කොමසාරිස්තුමියගෙන් ඊට අදාළ පිළිතුරු ලිපිය ලැබුණු පසුව සහ ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන අනුමැතිය අනුව ඉදිරි අවශ්‍ය කටයුතු සිදු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

II. කාවන්තිස්සපුර පොදු වෙළදපොළෙහි වර්තමාන තත්ත්වය පිළිබඳ තාක්ෂණ සේවා නිලධාරී විසින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර, පහත සඳහන් අඩුපාඩු පවතින බවට වාර්තා කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

- පොළ භූමියෙහි තණ කොළ සහ පැලැටි වැවී තිබුණි.
- වැසිකිළි භාවිතයට ගත නොහැකි තත්ත්වයට අපිරිසිදු වී තිබුණි.
- වැසිකිළි වල Commod 03 ක් සඳහා Bidet Shower නොතිබුණි.
- වැසිකිළි සඳහා ජල කරාම නොතිබුණි.
- ගෙට්ටුව සඳහා ඉබි යතුරු නොතිබුණි.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>කාවන්තිස්සපුර පොදු වෙළපොළෙහි පවතින අඩුපාඩු පදනම් කර ගනිමින්, කඩිනමින් එකී පොළෙහි හි අඩුපාඩු සකස් කර 2023 වර්ෂය සඳහා ටෙන්ඩර් ලබා දීමට කටයුතු සිදු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී.</u>

III. කිරින්ද පොදු වෙළඳපොළෙහි වර්තමාන තත්ත්වය පිළිබඳ තාක්ෂණ සේවා නිලධාරී විසින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර, පහත සඳහන් අඩුපාඩු පවතින බවට වාර්තා කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

- පෙර යොදා තිබූ වැසිකිළි 04 සඳහා ජල කරාම නොතිබුණි.
- සින්ක් එක සඳහාද ජල කරාමයක් නොතිබුණි.
- පෙර යොදා තිබූ ½" PVC බට කිහිපයක් ද නොතිබුණි.
- වැසිකිළි භාවිතයට ගත නොහැකි තත්ත්වයට අපිරිසිදු වී තිබුණි.
- පොළ භූමිය තුළ තණ කොළ සහ පැලෑටි වැවී තිබුණි.
- ගේට්ටුව ලොක් කිරීම සඳහා ඉබි යතුරු නොතිබුණි.
- මාලු වෙළඳසැල ආසන්නයෙහි පිරිසිදු කිරීම් කටයුතු සඳහා අමතර ජල කරාමයක් යොදා ජල සැපයුමක් ලබා දීමේ අවශ්‍යතාවයක් තිබුණි.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

කිරින්ද පොදු වෙළපොළෙහි පවතින අඩුපාඩු පදනම් කර ගනිමින්, කඩිනමින් එකී පොළෙහි හි අඩුපාඩු සකස් කර 2023 වර්ෂය සඳහා ටෙන්ඩර් ලබා දීමට කටයුතු සිදු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී.

IV. තිස්සමහාරාම බල ප්‍රදේශයේ සිදු කරනු ලබන ඉඩම් අනුබෙදුම් අනුමත කිරීම, ගොඩනැගිලි සංවර්ධන අනුමත කිරීම හා අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා 2022 වර්ෂයේ ජනවාරි මාසයේ සිට ජූලි මාසය දක්වා සැලසුම් කමිටුවට යොමු කරන ලද සැලසුම්පත් ලේඛන ගරු මහා සාබවට ඉදිරි කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

| 2022 ජනවාරි මාසය- සැලසුම් කමිටු වාර්තාව | | | | |
|---|---|---|---|---|
| අනු අංක | ලි.ප.අ. | නම | අනුමත වීම/නොවීම | කමිටු දිනය |
| 1 | අ/බෙ/2021/130 | එම්.ඩී.පී. කුරේ | අනුමත විය | 2022.01.11 |
| 2 | අ/බෙ/2021/132 | එම්.ඩී.පී. කුරේ | අනුමත විය | 2022.01.11 |
| 3 | අ/බෙ/2021/136 | එන්.ජී. ජයනන්ද රේමන් | අනුමත විය | 2022.01.11 |
| 4 | අ/බෙ/2021/137 | එච්.කේ. ගාමිණී | අනුමත විය | 2022.01.11 |
| 5 | අ/බෙ/2021/138 | ජී.ඒ. සුනිල් ශාන්ත | අනුමත විය | 2022.01.11 |
| 6 | අ/බෙ/2021/134 | ඒ.ඒ. විජේරත්න | අනුමත නොවිය | 2022.01.11 |
| 7 | අ/බෙ/2021/140 | එච්.ජී. රිසාන් ඉන්දික | අනුමත විය | 2022.01.11 |
| 8 | අ/බෙ/2021/125 | කේ. ලයනල් | අනුමත විය | 2022.01.11 |
| 9 | අ/බෙ/2021/142 | ඩබ්.පී.ඒ. පද්මසේන | අනුමත විය | 2022.01.11 |
| 10 | අ/බෙ/2021/127 | එම්.එල්. අනුර | අනුමත නොවිය | 2022.01.11 |
| 11 | අ/බෙ/2021/139 | ටී.ඩබ්.කේ. ප්‍රදීප් කුමාර | අනුමත නොවිය | 2022.01.11 |
| 12 | අ/බෙ/2021/139 | ටී.ඩබ්.කේ. ප්‍රදීප් කුමාර | අනුමත විය | 2022.01.25 |
| 13 | අ/බෙ/2021/133 | ජී. බුද්ධික තුෂාර ජයවිලාල් | අනුමත විය | 2022.01.25 |
| 14 | අ/බෙ/2021/145 | පී.එන්. පුංචිහේවා | අනුමත විය | 2022.01.25 |
| 15 | අ/බෙ/2021/146 | එල්.වයි. අයිවන් එරන්ස් | අනුමත විය | 2022.01.25 |
| 16 | අ/බෙ/2020/78 | එන්.ඒ. නාලිකා තරංගනී | අනුමත විය | 2022.01.25 |
| 17 | අ/බෙ/2021/83 | එච්. මුතුමාල | අනුමත විය | 2022.01.25 |
| 18 | අ/බෙ/2021/104 | කරුණාවතී රාජපක්ෂ | අනුමත විය | 2022.01.25 |
| 19 | අ/බෙ/2022/02 | පී.කේ.ශිරාණි | අනුමත විය | 2022.01.25 |
| 20 | අ/බෙ/2022/04 | එච්.කේ.ඩබ්. නිමල් | අනුමත විය | 2022.01.25 |
| 21 | අ/බෙ/2022/01 | හරින්ද්‍ර පරණමාන | අනුමත විය | 2022.01.25 |
| 22 | අ/බෙ/2021/91 | අයි.ඒ. ජයසූරිය | අනුමත විය | 2022.01.11 |
| 23 | අ/බෙ/2021/95 | එම්.පී. මහේෂිකා | අනුමත විය | 2022.01.11 |
| 24 | අ/බෙ/2021/96 | එම්.පී. මහේෂිකා | අනුමත විය | 2022.01.11 |

| | | | | |
|---|---|---|---|---|
| 25 | අ/බෙ/2021/110 | එස්.ඒ. සඳරුවන් | අනුමත විය | 2022.01.11 |
| 26 | අ/බෙ/2021/112 | ඩබ්.ජී. ප්‍රියා ඉරෝෂ් | අනුමත විය | 2022.01.11 |
| 27 | අ/බෙ/2021/113 | එච්.ජී. රිෂාන් ඉන්දික | අනුමත විය | 2022.01.11 |
| 28 | අ/බෙ/2021/114 | වී.පී.ඒ. පද්මසේන | අනුමත විය | 2022.01.11 |
| 29 | අ/බෙ/2021/102 | ඩබ්.එම්.එම්. ඉෂාර | අනුමත විය | 2022.01.25 |
| 30 | අ/බෙ/2022/01 | එච්.සී.ඩබ්. ලහිරු එරන්ද | අනුමත විය | 2022.01.25 |

| **2022 පෙබරවාරි මාසය- සැලසුම් කමිටු වාර්තාව** | | | | |
|---|---|---|---|---|
| **අනු අංක** | **ලි.ප.අ.** | **නම** | **අනුමත වීම/නොවීම** | **කමිටු දිනය** |
| 1 | අ/බෙ/2021/148 | රම්‍යා ලලනි සමරවීර | අනුමත විය | 2022.02.10 |
| 2 | අ/බෙ/2022/03 | එන්.එස්.ජගත් කීර්ති | අනුමත විය | 2022.02.10 |
| 3 | අ/බෙ/2022/05 | පී. ඒ.සනෝජා අනුරුද්ධිකා | අනුමත විය | 2022.02.10 |
| 4 | අ/බෙ/2022/09 | පී.ජේ.වී.මහේෂ් | අනුමත විය | 2022.02.10 |
| 5 | අ/බෙ/2022/10 | රෝහණ කුමාර | අනුමත විය | 2022.02.10 |
| 6 | අ/බෙ/2022/08 | එස්.වී.ඒ.පුෂ්ප කුමාර | අනුමත නොවිය | 2022.02.10 |
| 7 | අ/බෙ/2022/11 | කේ.පී.චන්දිමාල් | අනුමත විය | 2022.02.15 |
| 8 | අ/බෙ/2022/13 | පී.ඒ.දයාල් | අනුමත විය | 2022.02.15 |
| 9 | අ/බෙ/2021/134 | ඒ.ඒ.චන්ද්‍රරත්න | අනුමත විය | 2022.02.24 |
| 10 | අ/බෙ/2022/14 | දුමින්ද හුලංගම | අනුමත විය | 2022.02.24 |
| 11 | අ/බෙ/2022/15 | ඩබ්.එල්.පී.විජේවර්ධන | අනුමත විය | 2022.02.24 |
| 12 | අ/බෙ/2022/16 | ඩබ්.පී.එන්.මෙන්දිස් | අනුමත විය | 2022.02.24 |
| 13 | අ/බෙ/2022/17 | එම්.ජේ.ප්‍රියාන් කුරේ | අනුමත විය | 2022.02.24 |
| 14 | අ/බෙ/2022/19 | ජේ.පී.අමරතුංග | අනුමත විය | 2022.02.24 |
| 15 | අ/බෙ/2022/20 | සංදීප් ජයවර්ධන | අනුමත විය | 2022.02.24 |
| 16 | අ/බෙ/2022/22 | ජේ.එල්.පී.බහනු | අනුමත විය | 2022.02.24 |
| 17 | අ/බෙ/2022/23 | කේ.පී.ජී.ජනක බන්දුල | අනුමත විය | 2022.02.24 |
| 18 | අ/බෙ/2022/12 | එම්.ජී.හෂාන් මධුශංක | අනුමත නොවිය | 2022.02.24 |
| 19 | අ/බෙ/2022/24 | ජේ.එම්.ඩබ්.අමල් ඉෂාන් | අනුමත විය | 2022.02.24 |
| 20 | අ/බෙ/2022/18 | ජේ.පී.අමරතුංග | අනුමත විය | 2022.02.28 |
| 21 | අ/බෙ/2022/28 | බී.ආර්.ආර්.කුසුම්සිරි | අනුමත විය | 2022.02.28 |
| 22 | සං/අ/2021/88 | තල් සංවර්ධන මණ්ඩලය | අනුමත විය | 2022.01.10 |
| 23 | සං/අ/2021/89 | එම්.එම්.රොෂාන් චන්දන | අනුමත විය | 2022.01.10 |
| 24 | සං/අ/2021/111 | එම්.ටී.දිමුතු ප්‍රියාන් | අනුමත විය | 2022.01.10 |
| 25 | සං/අ/ 2021/04 | ආර්.ජී.ජයදාස | අනුමත විය | 2022.01.10 |
| 26 | සං/අ/2022/08 | ජේ.එම්.අසංක | අනුමත විය | 2022.01.10 |
| 27 | සං/අ/2022/10 | එච්.ජී.ජෝතිපාල | අනුමත විය | 2022.01.10 |
| 28 | සං/අ/2021/109 | ජේ.ප්‍රියා වසන්ති | අනුමත නොවිය | 2022.01.10 |
| 29 | සං/අ/2017/48 | ඒ.එම්.පී.ලකිත් | අනු.ස.අනුමත විය | 2022.01.10 |
| 30 | සං/අ/2020/107 | එම්.එම්.කමල් සුජීව | අනු.ස.අනුමත විය | 2022.01.10 |
| 31 | සං/අ/2021/103 | එන්.ජී.ප්‍රියන්ති | අනු.ස.අනුමත විය | 2022.01.10 |
| 32 | සං/අ/2013/12 | මරවින් විරාන් පෙරේරා | අනු.ස.අනුමත විය | 2022.01.10 |
| 33 | සං/අ/2022/02 | පී.ඒ.එස්.අනුරුද්ධිකා | අනුමතයි | 2022.02.15 |
| 34 | සං/අ/2022/03 | රෝහණ කුමාර සමරවීර | අනුමතයි | 2022.02.15 |
| 35 | සං/අ/2022/05 | ඩබ්.පී.නාමල් ප්‍රියන්ත | අනුමතයි | 2022.02.15 |
| 36 | සං/අ/2022/06 | අයි.කේ.ඒ.අමරකීර්ති | අනුමතයි | 2022.02.15 |
| 37 | සං/අ/2022/07 | එම්.ජී.රොමේෂ් ශෂින්ද්‍ර | අනුමතයි | 2022.02.15 |
| 38 | සං/අ/2022/09 | එච්.ඩබ්.ඒ.ඇඩ්ලින් | අනුමතයි | 2022.02.15 |
| 39 | සං/අ/2022/12 | එච්.සමන්ති කුමාරි | අනුමතයි | 2022.02.24 |
| 40 | සං/අ/2022/13 | කේ.ඩී.එස්.ආර්.උපසේන | අනුමතයි | 2022.02.24 |

| | | | | |
|---|---|---|---|---|
| 41 | සං/අ/2022/14 | බී.එල්.අසන්ත | අනුමතයි | 2022.02.28 |
| 42 | සං/අ/2022/16 | ජේ.එම්.ඩබ්.අමල් ඉෂාන් | අනුමතයි | 2022.02.28 |
| 43 | සං/අ/2022/18 | නිලූක් ලක්ෂාන් | අනුමතයි | 2022.02.28 |
| 44 | සං/අ/2022/21 | එස්.ජේ.විජේසුන්දර | අනුමතයි | 2022.02.28 |
| 45 | සං/අ/2022/22 | බී.ආර්.රෝහිත | අනුමතයි | 2022.02.28 |

| **2022 මාර්තු මාසය- සැලසුම් කමිටු වාර්තාව** | | | | | |
|---|---|---|---|---|---|
| **අනු අංක** | **ලි.ප.අ.** | **නම** | **අනුමත වීම/නොවීම** | | **කමිටු දිනය** |
| 1 | අ/බෙ/2022/07 | එස්.ඒ.සුනිල් ශාන්ත | අනුමත විය | | 2022.03.11 |
| 2 | අ/බෙ/2022/25 | ඩබ්.ජී.විමුක්ති දේශප්‍රිය | අනුමත විය | | 2022.03.11 |
| 3 | අ/බෙ/2022/27 | එච්.ජී.යසිත් දයන්ත | අනුමත විය | | 2022.03.11 |
| 4 | අ/බෙ/2022/29 | ඩබ්.පී.කුලතුංග | අනුමත විය | | 2022.03.11 |
| 5 | අ/බෙ/2022/30 | ඕ.එම්.රේණුකා දමයන්ති | අනුමත විය | | 2022.03.11 |
| 6 | අ/බෙ/2022/22 | ටී.පී.චිත්‍රපාලි | අනුමත නොවිය | | 2022.03.11 |
| 7 | අ/බෙ/2021/09 | කේ.එච්.ඒ.ඉරේෂා උදය | අනුමත විය | | 2022.03.11 |
| 8 | අ/බෙ/2022/31 | එම්.ජී.ජී.සී.නන්දනී | අනුමත විය | | 2022.03.14 |
| 9 | අ/බෙ/2022/22 | ටී.පී.චිත්‍රපාලි | අනුමත විය | | 2022.03.31 |
| 10 | අ/බෙ/2022/32 | දිනුක් විජෙසිංහ | අනුමත විය | | 2022.03.31 |
| 11 | අ/බෙ/2022/33 | එච්.එන්.ජයතේරිස් | අනුමත විය | | 2022.03.31 |
| 12 | අ/බෙ/2022/34 | එම්.ඩී.පී.කුරේ | අනුමත විය | | 2022.03.31 |
| 13 | අ/බෙ/2022/35 | එම්.ඒ.රංජිත් | අනුමත විය | | 2022.03.31 |
| 14 | අ/බෙ/2022/36 | එම්.ඒ.ඥානවිපුල | අනුමත විය | | 2022.03.31 |
| 15 | අ/බෙ/2022/38 | අනුර පලිහක්නාර | අනුමත නොවිය | | 2022.03.31 |
| 16 | අ/බෙ/2022/37 | එස්.පී.වීරවර්ණ | අනුමත විය | | 2022.03.31 |
| 17 | සං/අ/2022/11 | පසිඳු ප්‍රසංග | අනුමත විය | | 2022.03.11 |
| 18 | සං/අ/2022/15 | කේ.එච්.ඒ.අල්මේදා | අනුමත විය | | 2022.03.11 |
| 19 | සං/අ/2022/17 | ඩබ්.ජී.විමුක්ති දේශප්‍රිය | අනුමත විය | | 2022.03.11 |
| 20 | සං/අ/2022/23 | ඩබ්.ටී.වික්‍රමසිංහ | අනුමත විය | | 2022.03.11 |
| 21 | සං/අ/2021/117 | අයි.එම්.ජී.පියසේන | අනුමත විය | | 2022.03.14 |
| 22 | සං/අ/2022/24 | ඩබ්.පී.ටී.පියසේන | අනුමත විය | | 2022.03.14 |
| 23 | සං/අ/2022/25 | එම්.බී.ගාමිණි | අනුමත විය | | 2022.03.14 |
| 24 | සං/අ/2022/26 | ප්‍රගීත් චන්දිමාල් | අනුමත විය | | 2022.03.14 |
| 25 | සං/අ/2022/28 | ප්‍රියන්ත විජේසේකර | අනුමත විය | | 2022.03.14 |
| 26 | සං/අ/2022/29 | ඩී.බී.තරංග චමින්ද | අනුමත විය | | 2022.03.14 |
| 27 | සං/අ/2022/30 | ඩබ්.ජී.ඉන්දික සමීර | අනුමත විය | | 2022.03.14 |
| 28 | සං/අ/ 2022/31 | හේවාගමගේ අමිල | අනුමත විය | | 2022.03.31 |
| 29 | සං/අ/2022/34 | එම්.ඩී.පී.කුරේ | අනුමත විය | | 2022.03.31 |
| 30 | සං/අ/2022/36 | එම්.ජී.සුනිල් ශාන්ත | අනුමත විය | | 2022.03.31 |
| 31 | සං/අ/2022/27 | ටී.පී.චිත්‍රපාලි | අනුමත නොවිය | අනුමත නොවිය | 2022.03.14 |
| 32 | සං/අ/2021/107 | එච්.ජී.යසිත් දයන්ත | අනුමත නොවිය | අනුමත නොවිය | 2022.03.11 |
| 33 | සං/අ/2022/20 | එම්.ජී.හෂාන් මධුශංක | අනුමත නොවිය | | 2022.03.11 |
| 34 | සං/අ/2022/35 | පුබුදු චින්තක අලුත්ගෙදර | අනුමත නොවිය | | 2022.03.31 |
| 35 | සං/අ/2022/33 | දිනුක් ඇශ්ලි ජේසිංහ | අනුමත නොවිය | | 2022.03.31 |
| 36 | සං/අ/2022/27 | ටී.පී.චිත්‍රපාලි | අනුමත විය | | 2022.03.31 |
| 37 | සං/අ/2018/42 | ඒ.කේ.සුමිත් | අනු.ස.අනුමත විය | | 2022.03.11 |
| 38 | සං/අ/2020/132 | සුසිල් ප්‍රියන්ත | අනු.ස.අනුමත විය | | 2022.03.11 |
| 39 | සං/අ/2021/05 | අමිල රත්නායක | අනු.ස.අනුමත විය | | 2022.03.14 |
| 40 | සං/අ/2021/66 | මහේෂ් මංජුල | අනු.ස.අනුමත විය | | 2022.03.14 |
| 41 | සං/අ/2020/99 | එන්.එච්.නදීෂා දිල්රුක්ෂි | අනු.ස.අනුමත විය | | 2022.03.14 |

| | | | | |
|---|---|---|---|---|
| 42 | සං/අ/2021/53 | සුරංග වන්නිආරච්චි | අනු.ස.අනුමත විය | 2022.03.31 |
| 43 | සං/අ/2020/64 | ඊ.ඒ.සමන් ප්‍රියන්ත | අනු.ස.අනුමත විය | 2022.03.31 |

| **2022 අප්‍රේල් මාසය- සැලසුම් කමිටු වාර්තාව** | | | | |
|---|---|---|---|---|
| **අනු අංක** | **ලි.ප.අ.** | **නම** | **අනුමත වීම/නොවීම** | **කමිටු දිනය** |
| 1 | අ/බෙ/2022/44 | එම්.මෛත්‍රීපාල | අනුමත විය | 2022.04.08 |
| 2 | අ/බෙ/2022/45 | ජේ.එස්.ජස්ලින් හාමි | අනුමත විය | 2022.04.08 |
| 3 | අ/බෙ/2022/08 | එස්.වී.ඒ.සරත් | අනුමත විය | 2022.04.29 |
| 4 | අ/බෙ/2022/12 | එම්.ජී.හශාන් මධුෂංක | අනුමත විය | 2022.04.29 |
| 5 | අ/බෙ/2022/39 | ඒ.පී.දිනූෂා සුරංගනී | අනුමත විය | 2022.04.29 |
| 6 | අ/බෙ/2022/46 | එස්.ඒ.විජේසිංහ | අනුමත විය | 2022.04.29 |
| 7 | අ/බෙ/2022/47 | එස්.වී.ඒ.ජේ.නිමාලි | අනුමත විය | 2022.04.29 |
| 8 | අ/බෙ/2020/109 | ඩබ්.ඒ.නිශාන් මධුරංග | අනුමත විය | 2022.04.29 |
| 9 | අ/බෙ/2022/48 | පී.රශීමා නයෝලි | අනුමත විය | 2022.04.29 |
| 10 | අ/බෙ/2022/49 | යූ.එච්.ශාන්ති | අනුමත විය | 2022.04.29 |
| 11 | අ/බෙ/202238 | අනුර පලිහක්කාර | අනුමත නොවිය | 2022.04.29 |
| 12 | අ/බෙ/2022/50 | එන්.ජී.රංජිත් අශෝක | අනුමත වීය | 2022.04.29 |
| 13 | සං/අ/2022/37 | එම්.එම්.කේ.ප්‍රියංකා | අනුමත විය | 2022.04.08 |
| 14 | සං/අ/2022/37(1) | එස්.එච්.දර්ශන | අනුමත විය | 2022.04.08 |
| 15 | සං/අ/2022/38 | ආර්.ජී.එස්.ඉන්දික | අනුමත විය | 2022.04.29 |
| 16 | සං/අ/2022/39 | පී.ජී.සංඛ විමුක්ති | අනුමත විය | 2022.04.29 |
| 17 | සං/අ/2022/40 | යූ.එච්.ශාන්ති | අනුමත විය | 2022.0429 |
| 18 | සං/අ/2009/02 | ලලිත් ලාල්පෙ වික්‍රම | අනුමත නොවිය | 2022.04.08 |
| 19 | සං/අ/2021/41 | අයි.එස්.කුමාර | අනු.ස.අනුමත විය | 2022.04.08 |
| 20 | සං/අ/2020/72 | ඩබ්.ඒ.නිමල් | අනු.ස.අනුමත විය | 2022.04.08 |
| 21 | සං/අ/2020/26 | ඩබ.එච.කේ.සුරංග | අනු.ස.අනුමත විය | 2022.04.08 |
| 22 | සං/අ/2021/81 | බී.එස්.චන්ද්‍ර කුමාර | අනු.ස.අනුමත විය | 2022.04.08 |
| 23 | සං/අ/2019/65 | චතුර කාංචන මාණවඩු | අනු.ස.අනුමත විය | 2022.04.08 |
| 24 | සං/අ/2021/45 | ටී.ඩබ්.කේ.එස්.කුමාර | අනු.ස.අනුමත විය | 2022.04.29 |
| 25 | සං/අ/2019/120 | එස්.ජේ.විජේසුන්දර | අනු.ස.අනුමත විය | 2022.04.29 |
| 26 | සං/අ/2020/19 | එස්.ජේ.විජේසුන්දර | අනු.ස.අනුමත විය | 2020.04.29 |
| 27 | සං/අ/2022/08 | ජේ.එම්.අසංක | අනු.ස.අනුමත විය | 2020.04.29 |

| **2022 මැයි මාසය- සැලසුම් කමිටු වාර්තාව** | | | | |
|---|---|---|---|---|
| **අනු අංක** | **ලි.ප.අ.** | **නම** | **අනුමත වීම/නොවීම** | **කමිටු දිනය** |
| 1 | අ/බෙ/2022/38 | අනුර පලිහක්කාර | අනුමත විය | 2022.05.08 |
| 2 | අ/බෙ/2022/41 | එස්.එච්.දර්ශන | අනුමත විය | 2022.05.08 |
| 3 | අ/බෙ/2022/51 | සුරේෂ් ඉලේසිංහ | අනුමත විය | 2022.05.08 |
| 4 | අ/බෙ/2022/52 | එච්.ජී.පී.ඩී.විජේසිරිවර්ධන | අනුමත විය | 2022.05.08 |
| 5 | අ/බෙ/2022/42 | ඩී.බී.සීබුද්ධදාස | අනුමත නොවිය | 2022.05.08 |
| 6 | අ/බෙ/2022/43 | ඩී.බී.සීබුද්ධදාස | අනුමත නොවිය | 2022.05.08 |
| 7 | අ/බෙ/2022/58 | සුරේෂ් ඉලේසිංහ | අනුමත නොවිය | 2022.05.08 |
| 8 | අ/බෙ/2022/40 | ඉසුරු මධුශංක | අනුමත නොවිය | 2022.05.08 |
| 9 | අ/බෙ/2022/57 | එම්.ජී,එඩ්වින් සිල්වා | අනුමත විය | 2022.05.22 |
| 10 | සං/අ/2021/107 | එච්.ජී.යසිත් දයන්ත | අනුමත විය | 2022.05.22 |
| 11 | සං/අ/2021/109 | ජේ.ප්‍රියා වසන්ති | අනුමත විය | 2022.05.22 |
| 12 | සං/අ/2022/20 | එම්.ජී.හශාන් මධුෂංක | අනුමත විය | 2022.05.22 |
| 13 | සං/අ/2020/140 | ඩබ්.ඒ.නිශාන් මධුරංග | අනුමත විය | 2022.05.08 |
| 14 | සං/අ/2020/63 | පී.එල්.සී.එල්.විජය | අනු.ස.අනුමත විය | 2022.05.08 |

| | | | | |
|---|---|---|---|---|
| 15 | සං/අ/2020/81 | ඩී.ආරියරත්න | අනු.ස.අනුමත විය | 2022.05.08 |
| 16 | සං/අ/2020/49 | පී.ආරියරත්න | අනු.ස.අනුමත විය | 2022.05.08 |
| 17 | සං/අ/2020/110 | එල්.ඒ.එස්.උදයංග | අනු.ස.අනුමත විය | 2022.05.22 |
| 18 | සං/අ/2022/29 | ඩී.බීතරංග චමින්ද | අනු.ස.අනුමත විය | 2022.05.22 |
| 19 | සං/අ/2021/33 | ඔරිජිනල් ඇපරල් | අනු.ස.අනුමත විය | 2022.05.22 |

| **2022 ජුනි මාසය- සැලසුම් කමිටු වාර්තාව** | | | | |
|---|---|---|---|---|
| අනු අංක | ලි.ප.අ. | නම | අනුමත වීම/නොවීම | කමිටු දිනය |
| 1 | අ/බෙ/2022/59 | අයි.කේ.දිසානායක | අනුමත විය | 2022.06.09 |
| 2 | අ/බෙ/2022/55 | යාල හොලිඩේ රිසෝට් | අනුමත විය | 2022.06.09 |
| 3 | අ/බෙ/2022/58 | කපිල සූරිය ආරච්චි | අනුමත විය | 2022.06.09 |
| 4 | අ/බෙ/2022/53 | යූ.එච්.පියසීලි | අනුමත විය | 2022.06.28 |
| 5 | අ/බෙ/2022/62 | ප්‍රියන්ත විජේසේකර | අනුමත විය | 2022.06.28 |
| 6 | අ/බෙ/2022/63 | එන්.එච්.මාලනී | අනුමත විය | 2022.06.28 |
| 7 | අ/බෙ/2022/64 | රසිකා ප්‍රියානා ඉදුනිල් | අනුමත විය | 2022.06.28 |
| 8 | අ/බෙ/2022/65 | ජී.එම්.නිලංක | අනුමත විය | 2022.06.28 |
| 9 | සං/අ/2022/35 | පුබුදු චින්තක අලුත්ගෙදර | අනුමත විය | 2022.06.28 |
| 10 | සං/අ/2022/41 | කේ.එම්.ඉසුරු ලක්මාල් | අනුමත විය | 2022.06.28 |
| 11 | සං/අ/2022/42 | එම්.එච්.එම්.ජයන්ත | අනුමත විය | 2022.06.28 |
| 12 | සං/අ/ 2022/45 | එන්.ටී.ඩබ්.ගමගේ | අනුමත විය | 2022.06.28 |
| 13 | සං/අ/2022/46 | එන්.කේ.රංජිත් | අනුමත විය | 2022.06.28 |
| 14 | සං/අ/2022/47 | එස්.ඒ.ගයාන් ප්‍රසංග | අනුමත විය | 2022.06.28 |
| 15 | සං/අ/2022/48 | ජී.එම්.නිලංක | අනුමත විය | 2022.06.28 |
| 16 | සං/අ/2021/43 | ඩබ්.පී.නිමල් | අනු.ස.අනුමත විය | 2022.06.09 |
| 17 | සං/අ/2022/41 | කේ.එම්.ඉසුරු ලක්මාල් | අනු.ස.අනුමත විය | 2022.06.28 |

| **2022 ජූලි මාසය- සැලසුම් කමිටු වාර්තාව** | | | | |
|---|---|---|---|---|
| අනු අංක | ලි.ප.අ. | නම | අනුමත වීම/නොවීම | කමිටු දිනය |
| 1 | අ/බෙ/2022/67 | පී.ජී,නිමල් | අනුමත විය | 2022.07.01 |
| 2 | අ/බෙ/2022/66 | ඩී.ඩබ්.පී.නන්ද කුමාර | අනුමත නොවිය | 2022.07.01 |
| 3 | අ/බෙ/2022/66 | ඩී.ඩබ්.පී.නන්ද කුමාර | අනුමත විය | 2022.07.01 |
| 4 | අ/බෙ/2022/58 | සුරේෂ් ඉලේසිංහ | අනුමත නොවිය | 2022.07.01 |
| 5 | සං/අ/2022/50 | පී.ජී,නිමල් | අනුමත විය | 2022.07.01 |
| 6 | සං/අ/2022/51 | එස්.වී.ඒ.පුෂ්ප කුමාර | අනුමත විය | 2022.07.01 |
| 7 | සං/අ/2022/52 | ප්‍රසාද් නාරහොට හේවා | අනුමත විය | 2022.07.21 |
| 8 | සං/අ/ 2022/56 | ඉර්ෂාඩ් අලි | අනුමත විය | 2022.07.21 |
| 9 | සං/අ/2022/57 | ඉර්ෂාඩ් අලි | අනුමත විය | 2022.07.21 |
| 10 | සං/අ/2022/58 | ඉර්ෂාඩ් අලි | අනුමත විය | 2022.07.21 |
| 11 | සං/අ/2022/59 | පී.පී.සීකුමාර | අනුමත විය | 2022.07.21 |
| 12 | සං/අ/2022/61 | ඒ.එච්.හර්බට් සිල්වා | අනුමත විය | 2022.07.21 |
| 13 | සං/අ/2020/65 | ජී.සී.එස්.කේ.මහානාම | අනු.ස.අනුමත විය | 2022.07.01 |

## (ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන

I. හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක හපපා/ඩීයු06/නි.දි.වැ හා 2022.09.08 දිනැති ලිපිය මගින්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ස්ථිර මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්, පළාත් පාලන ආයතනවල බලතල පැවරීම අනුව ව්‍යවස්ථාපිතව පැවරී ඇති රාජකාරී ඉටු කිරීම සඳහා රජයේ නිවාඩු දින හා සති අන්ත නිවාඩු දින වලදී කාර්යයෙහි නිරත වීමට අනුමැතිය අයදුම් කර ඇති බවත්, මෙම නිලධාරීන් පළාත් පාලන ආයතනවල කාර්යය මණ්ඩලයට අයත් නොවන හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය යටතේ වැටුප් ලබන නිධාරීන් බැවින්, ඔවුන් සඳහා නිවාඩු දින වැටුප් ගෙවීමේදී ස්ථිරව වැටුප් ලබන ආයතනයෙන් අදාළ දිනවලට නිවාඩු දින වැටුප් ලබා නොගන්නා බවට තහවුරුවක් සමඟ සත්‍ය වශයෙන්ම පළාත් පාලන ආයතනය තුළ රාජකාරී

කටයුතුවල නියැලී ඇත්නම් පමණක් පවතින නීතිරීති හා විධිවිධානවලට අනුකූලව ගෙවීම් කටයුතු සිදු කිරීම සුදුසු බවට දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

❖ <u>**අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**</u>

<u>මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් සඳහා නිවාඩු දින වැටුප් ගෙවනු ලබන්නේ තිස්සමහාරාම බල ප්‍රදේශයේ පවතින වසම් 44 හිම බලපත්‍ර ගාස්තු අය කිරීමට අදාළ වාර්තාවන් ලබා ගැනීමට කටයුතු කිරීම වෙනුවෙන්ය. එම නිසා එකී කාර්ය සිදු කිරීම සඳහා මසකට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් දෙදෙනෙකුට නිවාඩු දින වැටුප් ගෙවීම සුදුසු බවට යෝජනා කරන අතර, රාජකාරී ඉටු කරනු ලබන නිලධාරීන් 07 දෙනා බෙදා වෙන් කර මාසිකව රාජකාරී සඳහා යෙදීමට කටයුතු සිදු කරන ලෙසට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී දැනුවත් කිරීම සුදුසු වන බවටත් දන්වා සිටින ලදී.</u>

❖ <u>**අදහස් දැක්වීම - ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා**</u>

මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් නිවාඩු දිනවල, අප බල ප්‍රදේශයේ බලපත්‍ර ගාස්තු අය කිරීමේ රාජකාරී ඉටු කරන බැවින්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් දෙදෙනෙකු සඳහා නිවාඩු දින වැටුප් ගෙවීම සුදුසු වන දන්වා සිටින ලදී.

❖ <u>**අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා**</u>

මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් හට රාජකාරී ඉටු කිරීම සඳහා ග්‍රාම සේවා වසම් වෙන් කර ලබා දී ඇති බැවින්, වසම් සියල්ලෙහිම බලපත්‍ර ගාස්තු අය කිරීමේ කාර්යය මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් දෙදෙනෙකුට පමණක් සිදු කළ නොහැකි බැවින්, ඒ සම්බන්ධයෙන් සොයා බලා තීරණයක් ලබා ගන්නා ලෙසට දන්වා සිටින ලදී.

❖ <u>**අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**</u>

<u>ප්‍රථමයෙන් බලපත්‍ර ගාස්තු අය කිරීම සඳහා අදාළ වාර්තාවන් ලබා ගැනීමට මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් දෙදෙනෙකු යොදවා ගැනීමට තීරණය කළද, ගරු සභිකයින් ඉහතින් දක්වා ඇති කරුණු සලකා බලා, නිවාඩු දින වැටුප් ලබා දෙන ලෙස ඉල්ලා ඇති මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සියලු දෙනා සඳහාම නිවාඩු දින වැටුප් අනුමත කිරීමට ඒකමතිකව තීරණය කරන ලදී. එසේම මෙම නිලධාරීන් සියලු දෙනා සඳහාම නිවාඩු දින වැටුප් අනුමත කරන බැවින්, බලපත්‍ර ගාස්තු අය කිරීම කාර්යක්ෂමව සිදු කර ගත යුතු බවටත්, බලපත්‍ර ගාස්තු අය කරනු ලබන ස්ථාන ප්‍රමාණය වැඩි කර ගත යුතු බවටත් දන්වා සිටින ලදී.</u>

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

I. 2022.08.12 දින පැවැති මාසික මහා සභාවේදී ගරු සභික ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ආදාහනාගාරයේ විශාල වශයෙන් අබලි භාණ්ඩ, ශීට් කොළ, ලී ආදී බඩු බොහෝ ප්‍රමාණයක් ගොඩ ගසා ඇති අතර, ට්‍රැක්ටර් 06 ක් සහ ට්‍රේලර් 06 ක් ද තිබෙන බැවින්, එලෙසට ගොඩ ගසා ඇති භාණ්ඩ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගයන් මොනවාද යන්න ගරු සභික ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විමසීම් කරන ලදී.

❖ <u>**අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**</u>

<u>ආදාහනාගාර භූමියේ ගොඩ ගසා ඇති තිස්සමහාරාම උසාවියෙන් ගලවා ඉවත් කරන ලද ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ට්‍රැක්ටර් ට්‍රේලර් ඉදිරි භාණ්ඩ සමීක්ෂණයෙන් ලබා දෙන නිර්දේශයන් අනුව ඉදිරි කටයුතු සිදු කරන බවට ගබඩා භාර නිලධාරී විසින් වාර්තාවක් ලබා දී ඇති බව දන්වා සිටින ලදී.</u>

(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා -

- <u>ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා</u>

01. තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාර්ගය දෙපස පවත්වාගෙන යනු ලබන මාළු, එළවළු, පළතුරු හෝ විවිධ වෙළඳාම් කටයුතු සහ කිරින්ද වෙරළ උද්‍යානයේ පවත්වාගෙන යනු ලබන විවිධ වෙළඳාම් කටයුතු සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කොට වෙළඳ බලපත්‍රයක් නිකුත් කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා</u>

මාර්ග දෙපස සිදු කරනු ලබන අනවසර වෙළඳාම් සිදු කිරීමේ දී අක්‍රමවත්ව සිදු කරන අවස්ථාවන්ද පවතින බැවින්, මෙකී වෙළඳාම් සිදු කිරීමේ දී ක්‍රමවත්ව සිදු කරන ලෙසට ඔවුන්ව දැනුවත් කිරීම සුදුසු බව දන්වා සිටින ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා</u>

අනවසර වෙළඳාම් ඉවත් කිරීම සම්බන්ධයෙන් දීර්ඝ කාලයක සිට සාකච්ඡා කරන කරුණක් බවට පත් වී ඇත. මාර්ග දෙපස සිදු කරනු ලබන වෙළඳාම්වලට අනවසර ඉදිකිරීම්ද ඇතුළත් වන බැවින්, ඒ සඳහා බලපත්‍රයක් ලබා දීමට කටයුතු කළහොත් එම වෙළඳාම් සඳහා නීතිමය රාමුවක් ඉබේම සැකසෙනු ඇත. මෙම අවස්ථාවේ සභාවට ආදායම් ලබා ගැනීම සඳහා බලපත්‍ර ගාස්තුවක් අය කළත්, මෙකී ගැටළුවට ඉදිරියේ දී ද මුහුණ දීමට සිදු වන බැවින්, මෙකී කරුණ සම්බන්ධයෙන් තව දුරටත් සොයා බැලීම් සිදු කර තීරණයක් ලබා ගැනීම සුදුසු වන බව දන්වා සිටින ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>

මාර්ගය දෙපස අනවසර වෙළඳාම් සිදු කිරීම දීර්ඝ කාලයක් තිස්සේ සිදු කරනු ලැබුවද, ඔවුන් ඉවත් කිරීමට මේ දක්වා නොහැකි වී ඇත. මෙකී ගැටළුව 2011 වසරේ සිට සාකච්ඡා කළද, මෙතෙක් තීරණයකට එළඹීමට නොහැකි වී ඇත. මාර්ගය දෙපස තිබෙන අනවසර වෙළඳාම් සේම, කිරින්ද වෙරළ උද්‍යානයේ තිබෙන කඩවලින් ද කිසිදු ගාස්තුවක් අය නොකරනු ලබයි. මාර්ග දෙපස තිබෙන වෙළඳාම්, මාලු ලැලි මේ දක්වා ඉවත් කිරීමට කටයුතු සිදු නොවීමෙන් කාලයක් තිස්සේ සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි ගොස් ඇත. එම නිසා මේ සම්බන්ධයෙන් නිවැරදි තීරණයක් ලබා ගෙන අනවසර වෙළඳාම් ඉවත් කිරීම හෝ සිදු කරනු ලබන වෙළඳාම් සඳහා වසරක් සඳහා බලපත්‍රයක් ලබා දී සභාවට ආදායම් ලබා ගැනීමට කටයුතු සිදු කළ යුතු බවත්, ලබා දෙන එම බලපත්‍රය වෙළඳාම් කිරීම සඳහා වසරක් සඳහා ලබා දෙන බලපත්‍රයක් ලෙසටත්, මෙම නීත්‍යානුකූල අයිතියක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ නොහැකි බවටත් කොන්දේසිය ඇතුළත් කර, බලපත්‍රය සංශෝධනය කර ලබා දීම සුදුසු වන බවත් ප්‍රකාශ කර සිටින ලදී.

එසේම මෙම කිරින්ද වෙරළ උද්‍යානයේ කඩ පිහිටි ඉඩමට පෞද්ගලික ඔප්පුවක් තිබෙන බවටද යම් පුද්ගලයකු විසින් ලියවිලි ඉදිරිපත් කර ඇති බවත්, එම ඉඩමේ යම් සීමාවන් මුහුදු මැද සීමාවේ තිබෙන බවටත් එකී සැලසුම්වල පෙන්නුම් කරනු ලබයි. එමගින්ද මේ දක්වා කිසිදු ආදායමක් අය නොකිරීමෙන් සභාවට ලැබිය යුතු ආදායමක් වර්ෂ ගණනාවක් තිස්සේ අහිමි වී ගොස් ඇත.

- <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා</u>

මින් පෙර රජයේ ඉඩමක සිටියද එය අනවසර නිසා ජල, විදුලිය ලබා නොදෙන ලදී. නමුත් මේ වන විට අනවසර ස්ථානයක වෙළඳාම් කටයුතු සිදු කළද, ජල, විදුලිය ලබා ගැනීම අවශ්‍යතාවය අනුව සිදු කරනු ලබයි. එසේම මාර්ගය දෙපස සිදු කරනු ලබන අනවසර වෙළඳාම්වලින් යම් ප්‍රමාණයකින් බදු

මුදල් අය කිරීම සිදු කිරීමේදී යම් ප්‍රමාණයකින් අය කිරීමක් සිදු නොකරනු ලබයි. එම නිසා ඒ සම්බන්ධයෙන්ද අවධානය යොමු කළ යුතුය.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා</u>

යම් වෙළදාමක් සිදු කිරීමෙන් අය විය යුතු බදු මුදල සභාවට අය කර ගැනීම සිදු කළ යුතුය. නමුත් නගරයේ මාර්ග දෙපස වෙළදාම් සිදු කරනවා සේම, රටේ පවතින වත්මන් තත්ත්වයත් සමඟ ගම්වලද සුළු වෙළදාම් තම නිවාස ඉදිරිපිට මාර්ගයේ සිදු කරන බැවින්, ගාස්තු අය කිරීමේ දී නගරයේ සිදු කරන සිල්ලර වෙළදාම් වලින් අය කරන ගාස්තුවම ගම්වල මැසි ගසා ගෙන සිදු කරන සුළු වෙළදාම්වලින්ද අය කිරීමක් සිදු කරන්නේ ද යන්න විමසීම් කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා</u>

මහා පරිමාණ මාලු ලැලි පවත්වාගෙන යන වෙළදාම් නිසා කුඩා මාලු ලැලිවලට අසාධාරණයක් සිදු වනවා සේම, සිල්ලර වෙළදාමට ද මෙය එසේ බලපානු ලබයි. එම නිසා මෙම වෙළදාම් නියාමනයක් කළ යුතු බව ප්‍රකාශ කර සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා</u>

මාර්ග දෙපස සිදු කරනු ලබන අනවසර වෙළදාම් සඳහා බලපත්‍රයක් ලබා දෙන්නේ නම්, එම බලපත්‍රය වෙළදාමක් සිදු කිරීම වෙනුවෙන් වසරක් සඳහා ලබා දෙන බලපත්‍රයක් වන ලෙසටත්, එම බලපත්‍ර නීත්‍යානුකූල අයිතියක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ නොහැකි බවටත් යන කොන්දේසිය ඇතුළත් කර, බලපත්‍ර නැවත සංශෝධනය කිරීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>යෝධකණ්ඩිය ප්‍රදේශයේ මාලු විකිණීම සඳහා සකස් කර ඇති මාලු ලැලිවල සිල්ලර වෙළදාම් කටයුතු සිදු කරනු ලබන බැවින්, එය වහාම නතර කර මාර්ග දෙපස මාලු ලැලි ඉවත් කර, එකී ස්ථානය සඳහා මාලු ලැලි ගෙන යාමට කටයුතු කළ යුතුය.</u>

<u>කිරින්ද වෙරළ කඩ පිහිටි ඉඩමට පෞද්ගලික ඔප්පුවක් තිබෙන බවට යම් පුද්ගයෙකු විසින් ඔප්පුවක් ඉදිරිපත් කළද, 2004 සුනාමි ව්‍යවසනය සිදු වූ පසුව මුහුදු තීරයෙන් මීටර් 100 ක දුර සිටින සියලුම දෙනා එම ස්ථානවලින් ඉවත් වන ලෙසට එම කාලයේ හිටපු අතිගරු ජනාධිපතිතුමා විසින් ගැසට් පත්‍රයක් ද ගසා ඇති බැවින්, යම් අවස්ථාවක එම ස්ථානයේ ඇති කඩ කාමර ඉවත් කිරීමට සිදු වුවහොත්, ඉහත කී ගැසට් පත්‍රය පදනම් කර ගත හැකි බවත් ප්‍රකාශ කර සිටින ලදී.</u>

<u>දෙබරවැව පරණ මුතු ටෙක්ස් අසල හම්බන්තොට පුද්ගලයෙකු විසින් මහා පරිමාණයෙන් කිසිදු අවසරයකින් තොරව මාලු ලැල්ලක් පවත්වාගෙන යනු ලබයි. මෙකී මාලු ලැල්ල නිසා ගම්වල කුඩා පරිමාණයේ මාලු ලැලි පවත්වාගෙන යනු පුද්ගලයන්ට සිදුව ඇත්තේ අසාධාරණයකි. එම නිසා කිසිදු අවසරයක් නොගෙන සිදු කරන ගෙන යන මෙම මාලු ලැල්ල පිළිබඳව සොයා බලා කටයුතු කළ යුතු බවත් දන්වා සිටින ලදී.</u>

<u>යම් වෙළදාමක්, ව්‍යාපාරයක් පවත්වාගෙන යාම වෙනුවෙන් වසරක් සඳහා පමණක් බලපත්‍ර ගාස්තු අය කර බලපත්‍රයක් ලබා දීම සිදු කරනු ලබයි.</u>

<u>අද දින ගරු සභිකයින් සියලුම දෙනා ඉහත යෝජනාවට දක්වන ලද අදහස් පිළිබඳ සලකා බලා, යම් වෙළදාමකින් මාර්ගයට හෝ පරිසරයට අවහිරයක් හානියක් සිදු වන්නේ නම්, එවැනි වෙළදාම් සඳහා බලපත්‍රයක් ලබා නොදී, මාර්ග දෙපස සිදු කරනු ලබන වෙළදාම් සඳහා ජල, විදුලිය ලබා ගැනීමට නොහැකි වන සේ, වෙළදාමක් සිදු කිරීම වෙනුවෙන් පමණක් වසරක් සඳහා බලපත්‍රයක් ලබා දී ගාස්තු අය කිරීම සුදුසු බව සියලුම දෙනා ඒකමතිකව සම්මත කරන ලදී.</u>

එසේම එලෙස බලපත්‍ර ගාස්තු අය කිරීමෙන් සභාවට ද යම් ආදායමක් ලබා ගත හැකි බැවින්, එකී වෙළඳාම් සඳහා බලපත්‍රය ලබා දීමේදී එම බලපත්‍ර නීත්‍යානුකූල අයිතියක් ලබා ගැනීම සඳහා සහ ස්ථානයේ අයිතිය නීත්‍යානුකූල කර ගැනීම සඳහා ඉදිරිපත් කළ නොහැකි බවටත්, වෙළඳාමක් සිදු කිරීම වෙනුවෙන් වසරක් සඳහා පමණක් ලබා දෙන බලපත්‍රයක් ලෙසටත්, බලපත්‍රය සංශෝධනය කර ගත යුතුය.

තවද, ඉහත කී යෝජනාවට වැඩියමක් එකතු කර ගැනීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය, පළාත් පාලන සහකාර කාර්යාලයේ විමර්ෂණ නිලධාරී මහතෙකු, විගණකාධිපති කාර්යාලයේ නිලධාරියෙකු සහ මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ අප ආයතනයේ මහජන නියෝජිතයින්, අදාළ නිලධාරීන් එක්ව සාකච්ඡාවක් ලබා ගැනීම සුදුසු වන බවත් තව දුරටත් ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

02. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර සඳහා 37.5 Kg ගෑස් සිලින්ඩර් 10 ක් මිලදී ගැනීම වෙනුවෙන් වූ රු. 185,000.00 ක මුදල සෝමසිරි ස්ටෝර්ස් (අගුණුකොළපැලැස්ස) වෙත ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා

ගෑස් මිල ඉහල ගොස් තිබියදීත් අප ආයතනය විසින් පාඩු ලබමින් හෝ රු. 10,000.00 ක ගාස්තුවකට ආදාහන කටයුතු සිදු කළත්, මීට පෙර තිබූ මුදලකට වඩා ආදාහනාගාර ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් ජනතාව විවිධ මත ප්‍රකාශ කරනු ලබයි. එම නිසා ආදාහනයක් සිදු කිරීම වෙනුවෙන් යන මුළු පිරිවැය සඳහන් කර දැන්වීම් පුවරුවක් ආදාහනාගාරයේ ප්‍රදර්ශනය කිරීම කටයුතු කරන්නේ නම්, මේ සම්බන්ධව ජනතාව දැනුවත් කළ හැකි වනු ඇත.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා

මීට පෙර ආදාහන ගාස්තු සඳහා රු. 6,500.00 අය කිරීමේ දී පැවති ගෑස් මිල සහ ගෑස් මිල ඉහල ගොස් තිබියදී දැනට රු. 10,000.00 ක ගාස්තුවකට ආදාහන සිදු කළත්, ආයතනය පාඩු ලබමින් එය සිදු කරන බව ජනතාව නොදන්නා බැවින්, ජනතාවගේ දැන ගැනීම සඳහා අදාහනයක් සඳහා යන මුළු පිරිවැය ආදාහනාගාරය ඉදිරිපිට දැන්වීම් පුවරුවක ප්‍රදර්ශන කිරීම සුදුසු බව මා ද යෝජනා කරන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා

පසුගිය දිනක ආදාහනයක් සිදු කිරීම සඳහා ආදාහනාගාරය වෙන් කර ගැනීමට යම් පුද්ගලයෙකු පැමිණි පසුව ඊට අදාල ලියකියවිලි සියල්ල භාර ගෙන පසුව ගෑස් නොමැති බව පැවසීමෙන් එම පුද්ගලයාට යම් අපහසුතාවයකට පත් වීමට සිදුව ඇති බැවින්, ඉදිරියේ දී එලෙස කටයුතු සිදු නොවීමට විෂය නිලධාරීන් වග බලා ගත යුතු බවත් ප්‍රකාශ කර සිටින ලදී.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

අප කිසි දිනක ගෑස් නොමැතිව ආදාහන භාර ගෙන නොමැති බවත්, පසුගිය දිනක ආදාහනාගාරය කැඩී ඇති හේතුව නිසා ආදාහන භාර නොගත් බවත් ප්‍රකාශ කර සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාවේ අක්‍රිය වී ඇති වායු සමීකරණ යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් සිරිවර්ධන රෙෆ් ඇන්ඩ් එයාර් සර්විස් ආයතනයේ බිල්පත් අංක 2350 මඟින් ඉදිරිපත් කර ඇති රුපියල් 50450.00 ක මුදල එම ආයතනය වෙත ගෙවීම කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04. විමධ්‍යගත අයවැය වැඩසටහන-2021 යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘති සඳහා චෙක්පත් ලැබී ඇති බැවින්, මාගම අක්කර 20 මාර්ගයේ බෝක්කුව සකස් කිරීම සඳහා චෙක්පත් අංක 560383 යටතේ රු. 81,600.00 ක මුදල සහ බල ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණය වෙනුවෙන් චෙක්පත් අංක 560384 යටතේ ලැබී ඇති රු. 185,327.11 ක මුදල ගෙවීම් කටයුතු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>

ඉහත කී සංවර්ධන කටයුත්ත සිදු කිරීම සඳහා ගරු චමල් රාජපක්ෂ මැතිතුමාගේ විමධ්‍යගත ප්‍රතිපාදන වෙන් කර ලබා දුන් අතර, එකී සියලු වැඩ ප්‍රාදේශීය සභාව මගින් ඍජු ශ්‍රමික පදනම මත සිදු කිරීමට හැකි වූ බවත්, මෙම සංවර්ධන කටයුත්ත සාර්ථකව සිදු කර ගැනීමට හැකි වීම සම්බන්ධයෙන් ගරු චමල් රාජපක්ෂ මැතිතුමාට සහ ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කර සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05. විමධගත අයවැය වැඩසටහන 2021 යටතේ මැදවැලැන ආර්.සිල්වා මාවත පළමු පටුමග සහ ගඟසිරිපුර මුතුකුමාරණ මහතාගේ නිවස අසල සිට කිරිදි ඔය මාවත සංවර්ධනය කිරීම සඳහා LN 3348 සහ LN 8660 ටිපර් රථ සේවයේ යොදවා ගැනීම වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරි විසින් සකස් කරන ලද වාර්තාවට අනුව රු.240,000.00 ක මුදලක් අදාල ටිපර් රථ සඳහා ගෙවීම් කටයුතු කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා විසින් ස්ථිර කරන ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ඉහත කී සංවර්ධන කටයුත්ත සඳහා වෙන් වූ මුදලින් ප්‍රමාද ගාස්තු ලෙස රු. 18,957.84 ක මුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අය කර ගෙන ඇති බැවින්, එය එලෙසට සිදු කිරීම සම්බන්ධව ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභාවේ කණගාටුව ප්‍රකාශ කළ බවට දන්වා යවා, මෙකී මුදල නැවත අප වෙත ලබා ගැනීමට හැකි වන පරිදි අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට ප්‍රාදේශීය ලේකම්තුමියට දන්වා යැවිය යුතු බවට තීරණය විය.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් දේපළ 2023 වර්ෂය සඳහා බදු අයිතිය ලබා දීමට ලංසු කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීමටත්, අදාළ ගාස්තු සඳහන් ලංසු නිවේදනය අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ප්‍රසම්පාදන (ටෙන්ඩර්) දැන්වීමයි.</u>
<u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව</u>
<u>ඉද්පළ බදු දීම - 2023 වර්ෂය</u>

01. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පහත උප ලේඛනයෙහි දැක්වෙන වත්කම් 2023.01.01 දින සිට 2023.12.31දක්වා කාලයට බදු දිම සඳහා මා විසින් ලංසු කැඳවනු ලැබේ.
02. 2022.09.26 දින සිට 2022.10.13 දින තෙක් පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පහත උප ලේඛනයේ සඳහන් ඇති දේපළ සඳහා ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල් හා ආපසු නොගෙවන ලංසු පෝරම් ගාස්තු ගෙවීමෙන් පසු ලංසු අයදුම්පත් හා ලංසු කොන්දේසිපත් තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් ලබා ගත හැක. (තමාගේ පුද්ගලික හැඳුනුම්පත සහ පදිංචිය සනාථ කිරීමේ ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කරන අයට පමණක් පහත දැක්වෙන ගාස්තු අය කර නිකුත් කරනු ලැබේ.)

03. 2022.10.14 දින පෙ.ව. 10.00 දක්වා ලංසු අයදුම්පත් භාර ගන්නා අතර , එදිනම පෙ.ව. 10.30 ට ලංසුපත් විවෘත කිරීම තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේදී සිදු කෙරේ.

04. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලේකම් , ප්‍රාදේශීය සභාව , තිස්සමහාරාම යන ලිපිනයට ලංසුපත් භාර ගන්නා අවසාන දින නියමිත වේලාවට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ගෙනවිත් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

05. ලංසු අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී මුල් පිටපත , අනු පිටපත යනුවෙන් වෙන් වෙන්ව සඳහන් කර ලිපි කවරවල බහා එම ලිපි කවර 02 එක් ලිපි කවරයක බහා ලිපිකවරයේ වම්පස ඉහළ කෙලවරේ 2023 වර්ෂයේ ලංසු ඉදිරිපත් කිරිම යනුවෙන් සහ අයදුම්පත් ඉදිරිපත් කර ඇති දේපළෙහි නම සඳහන් කළ යුතුය. (එක් එක් දේපළ බදු ගැනීම සඳහා වෙන් වෙන්ව ලංසු අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.)

06. අසාධුගත ලේඛණයෙහි සිටින බදුකරුවන්ට ලංසුපත් නිකුත් නොකරනු ලබන අතර , ඕනෑම ලංසුපතක් භාර ගැනීමේ හා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතුය.

07. අවම ලන්සුවට අඩුවෙන් ඉදිරිපත් කරන ලංසු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර , එසේම අයදුම්පත් ලබා ගෙන ලංසුපත් ඉදිරිපත් නොකරන අයගේ ඇප මුදල් සභාව සතු කරනු ලැබේ.

08. මීට අමතරව ලංසු අයදුම්පත් ලබා දීමේ සිට රජය විසින් පනවනු ලබන සියලුම බදු මුදල් වලට යටත්ව ගෙවීම් කළ යුතුය.

09. වැඩි විස්තර කාර්යාල වේලාව තුලදී තිස්සමහාරාම ප්‍රාදේශීය සභා දුරකතන අංක 047-2237275 න් ලබා ගත හැක.

| අනු අංකය | බදු විෂයය | අවම ලන්සුව (රු) | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප මුදල (රු.ශත) | පෝරම් ගාස්තුව (රු.ශත) |
|---|---|---|---|---|
| 01 | පන්නෙගමුව පොදු වෙළඳපොළ සහ වැසිකිළිය | 1,644,000.00 | 50,000.00 | 5,000.00 |
| 02 | දෙබරවැව පොදු වෙළඳ පොළ සහ වැසිකිළිය | 2,078,181.81 | 50,000.00 | 5,000.00 |
| 03 | කිරින්ද පූජා නගර රථවාහන නැවතුම්පොළ | 1,207,710.00 | 10,000.00 | 500.00 |
| 04 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ | 495,882.00 | 5,000.00 | 500.00 |
| 05 | කිරින්ද පූජා නගර පැරණි වැසිකිළිය සහ නව වැසිකිළිය | 108,000.00 | 3,000.00 | 500.00 |
| 06 | කිරින්ද වෙරළ වැසිකිළිය හා නාන ස්ථානය | 165,700.00 | 2,000.00 | 500.00 |
| 07 | තිස්සමහාරාම පූජා නගර වැසිකිළිය | 137,910.00 | 3,000.00 | 500.00 |
| 08 | තිස්සමහාරාම බස්නැවතුම්පොළ නව වැසිකිළිය | 15,250.00 | 1,000.00 | 500.00 |
| 09 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ පොල් එලදාව (පොල් ගස් 08) | 8,040.00 | 1,000.00 | 500.00 |
| 10 | දෙබරවැව ධීවර වෙළඳසැල | 120,000.00 | 1,000.00 | 500.00 |
| 11 | දෙබරවැව පොදු වෙළඳපොළ ධීවර ගොඩනැගිල්ල | 162,000.00 | 1,000.00 | 500.00 |
| 12 | අකුරුගොඩ හන්දියේ වැසිකිළිය | 3,168.00 | 1,000.00 | 500.00 |
| 13 | තිස්සමහාරාම මාගම අක්කර 18 පොල් එලදාව (පොල් ගස් 07) | 2,250.00 | 1,000.00 | 500.00 |
| 14 | අකුරුගොඩ හන්දිය කඩ කාමර අසල නව වැසිකිළිය | 3,900.00 | 1,000.00 | 500.00 |
| 15 | තිස්සමහාරාම පැරණි බස්නැවතුම්පොළ පොල් එලදාව (පොල් ගස් 04) | 3,690.00 | 1,000.00 | 500.00 |

ඩබ්ලිව්.ජී. උපුල්,
සභාපති,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා</u>

පුවත්පත් දැන්වීම් පල කිරීමේ ගාස්තු ද මේ වන විට ඉහල ගොස් ඇති බැවින්, මෙම දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා වෙනත් සුදුසු විකල්පයක් තිබේද යන්න අවධානය යොමු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>අප ආයතනයෙන් ලබා දෙන සේවාවන් සියල්ල ඉදිරියේ දී අපගේ වෙබ් අඩවිය වෙත මුදා හැරීමට කටයුතු කරන බවත්, එමගින් අපගේ සේවාවන් පිලිබඳ ජනතාවට දැනුවත් විය හැකි වන බවත් ප්‍රකාශ කරන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

07. 2023 වර්ෂයට පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා සැපයුම්කරුවන් වශයෙන් ලියාපදිංචි කර ගැනීමට ලියාපදිංචි ආයතන වලින් පුද්ගලයින්ගෙන් හා නිෂ්පාදකයින්ගෙන් ඇමුණුමේ සඳහන් පරිදි ගාස්තු අය කර ඉල්ලුම්පත් කැඳවීමටත්, සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම ත්‍රෛභාෂාවෙන් පුවත්පත්වල පල කිරීම මෙම ගරු සභාව යෝජනා කරමි.

<u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව</u>

<u>2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම</u>

2023 වර්ෂය සඳහා මෙම සභාවට පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීමට සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම පිණිස ලියාපදිංචි ආයතන වලින් පුද්ගලයිනගෙන් හා නිෂ්පාදකයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

පහත සඳහන් එක් එක් සැපයුම් හා සේවාවන් සඳහා වෙන් වෙන් වශයෙන් ලියාපදිංචි වීමට එක් අයිතමයක් වෙනුවෙන් ආපසු ගෙවනු නොලබන රු. 1,000.00 ක ගාස්තුවක් අය කරනු ලැබේ.

තමන් විසින් A4 ප්‍රමාණයට සකස් කර ගන්නා ලද තමන්ගේ නම, ව්‍යාපාරයේ සියළුම ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත්‍රයක් මගින් අයදුම් කළ හැකි වන අතර , අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2022.11.30 දින වේ. නිෂ්පාදකයින් හා ව්‍යාපාර ආයතන මඟින් ඉල්ලුම්කරන අවස්ථාවන්හි දී ව්‍යාපාර නම ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපත අමුණා තිබීම අනිවාර්ය වේ.

චෙක්පත් මඟින් ලියාපදිංචි ගාස්තු ගෙවන්නේ නම් "සභාපති , තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව" නමට ලියා ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත් 2022.11.30 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැකිය. සියළුම අයදුම්පත් ''සභාපති, ප්‍රාදේශීය සභාව, තිස්සමහාරාම'' නමට තැපැල් මඟින් යොමු කල යුතු අතර, මුදල් ඇණවුම් භාර නොගනී.

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා පහත කොන්දේසි අදාළ වේ.

I. ලියාපදිංචි සැපයුම්කරුවන්ට අමතරව අවශ්‍ය වන අවස්ථාවන්හි දී වෙනත් අයගෙන් මිළ ගණන් කැඳවා භාණ්ඩ මිලදී ගැනීමේ බලය මෙම සභාවේ සභාපති/ලේකම් සතුය.

II. අවශ්‍ය අවස්ථාවන්හි දී සාම්පල් හා ආකෘති ඉදිරිපත් නොකරන හා ඇණවුම් පරිදි නියමිත ප්‍රමිතියට හා නියමිත කාල සීමාවන්හි දී භාණ්ඩ සැපයීම සිදු නොකරන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව අවලංගු කරනු ලැබිය හැකිය.

III. භාණ්ඩ සැපයූ දින සිට අවම වශයෙන් දින 45 ක් දක්වා ණය පහසුකම් සැපයුම්කරුවන් විසින් ලබා දිය යුතුය.

IV. සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් මුදල් ගෙවනු නොලැබේ.

V. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවර "2023 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

VI. ඇණවුම් පරිදි අදාළ භාණ්ඩ අණවුමේ දින සිට දින 10 ක් ඇතුළත සභාවට ප්‍රවාහනය කර දිය යුතුය. එලෙස නියමිත කාල සීමාව තුළ භාණ්ඩ හා ද්‍රව්‍ය ප්‍රවාහනය කර දීමට අපොහොසත් වන විටදී, එකී

ඇණවුම අවලංගු කර වෙනත් ස්ථානයකින් ද්‍රව්‍ය ලබා ගැනීමේ අයිතිය තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතුය.

| අනු අංකය | සැපයුම් | ආපසු නොගෙවන ලියාපදිංචි ගාස්තු (රු) |
|---|---|---|
| 01 | කාර්යාලීය ලිපි ද්‍රව්‍ය ( සියළුම ලිපි ලේඛන ද්‍රව්‍ය ) | 1,000.00 |
| 02 | කාර්යාලීය උපකරණ ලී බඩු, වානේ , ගෘහ භාණ්ඩ (අල්මාරි, මේස, පුටු, ලිපි ගොණු කැබිනට් හා පොත් රාක්ක, ප්ලාස්ටික් පුටු ) | 1,000.00 |
| 03 | සෞඛ්‍ය උපකරණ ( ඉදල්, කොසු, සබන් වර්ග, ටයිල් ක්ලීනර්, හාපික් , ෆීනෝල්, ලයිසෝල්, අත්වැසුම්, මුඛ ආවරණ, විෂබීජ නාශක වර්ග) | 1,000.00 |
| 04 | ටයර් හා ටියුබ්, බැටරි, රිම්ටේප් (වාහන සඳහා) | 1,000.00 |
| 05 | රථ වාහන සඳහා අමතර කොටස් (අත් ට්‍රැක්ටර්, මහ ට්‍රැක්ටර්, ජල බවුසර්, ටිපර්, බැකෝ යන්ත්‍ර , මෝටර් ග්‍රේඩර්, කැබ් රථ ඇතුළු සියළු වාහන සඳහා) | 1,000.00 |
| 06 | කර්මාන්ත සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, සාමාන්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය ( යකඩ, ජී.අයි. පයිප්ප සහ අමතර කොටස් ජල නල උපාංග, සිමෙන්ති, ප්ලාස්ටික්, ජල ටැංකි ඇතුළු ද්‍රව්‍ය) | 1,000.00 |
| 07 | තීන්ත වර්ග හා ඒ ආශ්‍රිත උපකරණ | 1,000.00 |
| 08 | නිල ඇඳුම් සඳහා අවශ්‍ය රෙදි වර්ග, වැහි කබා, ආරක්ෂිත පාවහන් | 1,000.00 |
| 09 | පරිගණක යන්ත්‍ර හා ඒ ආශ්‍රිත උපාංග (මොනිටර් වර්ග, වෛරස් මෘදුකාංග , කී බෝඩ්, යුපීස්, මවුස්) | 1,000.00 |
| 10 | පරිගණක පිටපත් යන්ත්‍ර හා මුද්‍රණ යන්ත්‍ර සඳහා අවශ්‍ය තීන්ත හා ටෝනර් කාර්රේජ්, රිබන් සැපයීම. | 1,000.00 |
| 11 | ඡායා පිටපත්, ෆැක්ස් / ඩුප්ලෝ / මල්ටි මීඩියා/පොජෙක්ටර් යන්ත්‍ර, මුදල් ගණින යන්ත්‍ර , මුද්‍රණ යන්ත්‍ර | 1,000.00 |
| 12 | වීථි පහන් හා විදුලි උපකරණ (වයර්, ස්විච්, බල්බ්,ප්ලග් ආදී ද්‍රව්‍ය) | 1,000.00 |
| 13 | ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය (වැලි, ගල්, ඉන්ටර්ලොක් ගල්,පස්, බොරළු, තාර, ගඩොල්) | 1,000.00 |
| 14 | කොන්ක්‍රීට් නිෂ්පාදනය (හියුම් පයිප්ප, කම්බි කණු, ළිං වළළු, සිමෙන්ති බ්ලොක් ගල් , මල් පෝච්චි ආදී) | 1,000.00 |
| 15 | ලිහිසි තෙල් වර්ග | 1,000.00 |
| 16 | පුස්තකාල පොත් හා ප්‍රකාශන | 1,000.00 |
| 17 | දැව, ලෑලි, පරාල, රීප්ප | 1,000.00 |
| 18 | මුද්‍රිත ලිපි ලේඛන, රබර් සීල් වර්ග , නාම පුවරු හා දැන්වීම් පුවරු සැපයීම | 1,000.00 |
| 19 | ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ (සංගීත භාණ්ඩ , ශබ්ද විකාශණ යන්ත්‍ර සැපයීම) | 1,000.00 |
| 20 | ගිනි නිවන උපකරණ සැපයීම | 1,000.00 |
| 21 | පානීය ජලය හා ජල සැපයුම (ජල පෙරන හා පානීය ජල බෝතල් සැපයීම) | 1,000.00 |
| 22 | මාර්ග නඩත්තු උපකරණ (තාච්චි, රේක්න, උදළු, විල් බැරෝ , අලවංගු, තණකොළ කපන යන්ත්‍ර සඳහා අවශ්‍ය නඩත්තු උපකරණ) | 1,000.00 |

- <u>සේවාවන්</u>

| අනු අංකය | සේවාවන් | ආපසු නොගෙවන ලියාපදිංචි ගාස්තු (රු) |
|---|---|---|
| 1 | වායු සමීකරණ යන්ත්‍ර / ෆැක්ස් යන්ත්‍ර / ඡායා පිටපත් යන්ත්‍ර අළුත්වැඩියා කිරීම. | 1,000.00 |
| 2 | පරිගණක යන්ත්‍ර / මුද්‍රණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම / පරිගණක ජාල ගත කිරීම. | 1,000.00 |
| 3 | වාහන කුලියට සැපයීම (එක්ස්කැවේටර් , ඩෝසර් , මගී ප්‍රවාහන වෑන් රථ හා බස් රථ , ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් , ටිපර් ) | 1,000.00 |
| 4 | ටයර් නැවත පිරවීම , ඩැග් කිරීම හා පැරණි ටයර් මිලට ගැනීම / වාහන කුෂන් කිරීම. | 1,000.00 |
| 5 | වීදුරු , ප්ලාස්ටික් , කාඩ්බෝඩ් , පත්තර ( පැරණි) මිලදී ගැනීම. | 1,000.00 |
| 6 | වාහනවල විදුලි පරිපථ හා මෝටර් අළුත්වැඩියා කිරීම | 1,000.00 |
| 7 | සියලු වාහන අළුත්වැඩියා කිරීම් හා සේවා කිරීම් ( ගරාජ් සේවාවන් ප්‍රදේශය තුළ) | 1,000.00 |
| 8 | 1. ලියවන පට්ටල් වැඩ හා ආශ්‍රිත සේවාවන්. ( ප්‍රදේශය තුළ ) | 1,000.00 |
| | 1. ප්‍රාදේශීය සභා විශේෂ උත්සව ඡායාරූප ගත කිරීම හා වීඩියෝ කිරීමේ සේවාවන්. ( ප්‍රදේශය තුළ) | 1,000.00 |
| | උද්‍යාන , වට රවුම් , මාර්ග දෙපස අලංකරණ සේවාවන්. | 1,000.00 |
| | මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා කුලියට ගැනීම. | 1,000.00 |

➢ ගැණුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා පහත පරිදි වේ.

| අනු අංකය | ගැණුම්කරුවන් | ආපසු නොගෙවන ලියාපදිංචි ගාස්තු (රු) |
|---|---|---|
| 1 | අපහරණය කරන ලද කාඩ්බෝඩ් | 1,000.00 |
| 2 | අපහරණය කරන ලද ප්ලාස්ටික් වතුර බෝතල් | 1,000.00 |
| 3 | අපහරණය කරන ලද බෝතල් කටු | 1,000.00 |
| 4 | අපහරණය කරන ලද ඝන ප්ලාස්ටික් | 1,000.00 |
| 5 | අපහරණය කරන ලද ටින් | 1,000.00 |
| 6 | අපහරණය කරන ලද E Vaste | 1,000.00 |
| 7 | අපහරණය කරන ලද පොලිතීන් | 1,000.00 |
| 8 | අපහරණය කරන ලද 100 g අඩු පොලිතීන් , ලන්ච්ෂීට් , ෂොපින් බෑග් | 1,000.00 |
| 9 | අපහරණය කරන ලද සෑජුෆෝම් (Regeform) | 1,000.00 |

❖ ඉහත ගාස්තු සඳහා VAT බදු අය නොවනු ඇත.

මේ පිළිබඳව වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 047-2237275 මඟින් විමසිය හැක.

ඩබ්ලිව්.ජී. උපුල්,
සභාපති,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2022
තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

08. ප්‍රාදේශීය සභාවේ රථවාහන අලුත්වැඩියා කිරීම, අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම හා සේවා කිරීම සඳහා කරන ලද රු. 50,000.00 ට වඩා වැඩි වැය කිරීම් සඳහා ගෙවීම් කිරීමට ඉදිරිපත් වූ පහත උපලේඛනයේ සඳහන් බිල්පත් වෙනුවෙන් ගෙවීම් අනුමැතිය ලබා දීමට මෙම ගරු සභාව යෝජනා කරමි.

උප ලේඛනය

| | වාහන අංකය | අලුත්වැඩියාව | | බිල්පත් අංකය-දිනය | මුදල |
|---|---|---|---|---|---|
| 1 | LL-7379 | පූර්ණ සේවා කිරීම | රෝහණ ඔටෝ සර්විස් | 308 – 22.08.19 | 60,640.00 |
| 2 | ZB-0413 | පූර්ණ සේවා කිරීම | රෝහණ ඔටෝ සර්විස් | 302 – 22.08.05 | 66,165.00 |
| 3 | ZA-5200 | පූර්ණ සේවා කිරීම | රෝහණ ඔටෝ සර්විස් | 313 – 08.31 | 73,500.00 |
| 4 | LM-5616 | 825 X 16 රිම්ටේප් 03, ටියුබ් 03, සියට් ටයර් 03 ක් මිළට ගැනීම | පෙරේරා ටයර් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් | PCJJ028034 – 08.22 | 253,050.00 |
| 5 | ZB-0413 | 900 X 20 රිම්ටේප් 02, ටියුබ් 02, සියට් ටයර් 02 ක් මිළට ගැනීම | පෙරේරා ටයර් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් | PCJJ028033 – 08.22 | 188,000.01 |
| 6 | LM-5616 | පූර්ණ සේවා කිරීම | රෝහණ ඔටෝ සර්විස් | 303 – 08.06 | 66,312.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

09. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සඳහා අනුමත කාර්ය මණ්ඩල ලේඛනයට අනුව ආදායම් පරීක්ෂක තනතුරු 02 ක් ඇතත්, මේ වන විට සේවය සිදු කරනුයේ එක් නිලධාරිනියක් පමණක් වන බැවින්, සභාවට ලැබිය යුතු ආදායම සහ හිඟ ආදායම් අය කර ගැනීම ඉතා පහල මට්ටමක පැවතීම විගණනයේ දෝෂ දර්ශනයට ලක් වන කරුණක් වී ඇත. මේ සඳහා විසඳුමක් ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ආදායම් පරීක්ෂක නිලධාරියෙකු පත් කරනු ලබන තෙක්, කාර්යාලයේ සිටින නිලධාරීන් අතුරින් එක් අයෙකු වැඩ බලන ආදායම් පරීක්ෂක නිලධාරී ලෙස පත් කිරීමට සහ ආදායම් ප්‍රවර්ධන නිලධාරී ලෙස තවත් නිලධාරියෙකු පත් කර ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>ආයතනයට ලැබිය යුතු ආදායම් අය වීම් සම්බන්ධයෙන් සොයා බලා ආදායම් අය කර ගැනීම් සඳහා සුදුසු වැඩපිළිවෙලවල් සකස් කර ආදායම් ලබා ගැනීමට අදාළ කටයුතු සිදු කිරීම සඳහා ආදායම් ප්‍රවර්ධන නිලධාරී ලෙස ආයතනයේ සංවර්ධන නිලධාරී ලෙස කටයුතු කරන බී.එල්.පී. රසාංග මහතා පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර, වැඩ බලන ආදායම් පරීක්ෂක නිලධාරියෙකු නම් කිරීමට අදාළ කටයුතු ලේකම්තුමියට සිදු කිරීම සඳහා උපදෙස් ලබා දෙන ලදී. එකී යෝජනාව සියලුම දෙනා ඒකමතිකව සම්මත කරන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

10. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු නව බහුකාර්ය ගොඩනැගිල්ලේ පහත මාලයේ ඇති කඩ කාමර විධිමත් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින්, බදු පදනම මත ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු ඉටු කිරීම කඩිනමින් සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණි මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත මෙම බහුකාර්ය ගොඩනැගිල්ල ඉදි කර ඇති නිසා, මෙකී කඩ කාමර එම අමාත්‍යාංශය හරහා ටෙන්ඩර් ලබා දීමක් ඇතැම් විටක සිදු විය හැකිය. එසේ වුවත් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇති තක්සේරුව පදනම් කර ගනිමින්, ගම්මානවල සිටින නව ව්‍යවසායකයින් හඳුනා ගෙන, ග්‍රාමීය නව ව්‍යවසායකයින්ටද තම ව්‍යාපාරික කටයුතු නගර මධ්‍යයේ සිදු කිරීම තුළින් ඔවුන්ගේ ආර්ථිකය ඉහල නැංවීමට හැකි වන බැවින්, මෙම කඩ කාමර ලබා දීමේ දී ග්‍රාමීය නව ව්‍යවසායකයින් තෝරා ගෙන බදු පදනම මත ලබා දීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.</u>

<u>එසේම තාක්ෂණ සේවා නිලධාරී වාර්තා ලබා ගෙන නව සභා කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිම කළ යුතු බවටත් දන්වා සිටින ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

11. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152(I) වගන්ති ප්‍රකාරව, සභාව විසින් පිළිගන්නට හෝ සම්මත කර ගන්නට යෙදුණ අතුරු ව්‍යවස්ථාවකින් පාලනය වන බලපත්‍රයට යටත් නොවන්නා වූ හා එම පනතේම 150 වගන්තිය යටතේ වූ කර්මාන්ත බද්දකට යටත් නොවන්නා වූ ස්ථාන හැර, අනෙකුත් උපලේඛන අංක 1 හි නිරූපිත ව්‍යාපාර වෙනුවෙන් පෙර වර්ෂය සඳහා වූ වෙළඳ ව්‍යාපාරයේ ආදායම අනුව පනතේ දැක්වෙන අනුප්‍රමාණ නොඉක්මවන්නාවූ අනුප්‍රමාණයන්ට අනුකූලව උපලේඛන අංක 1 හි දක්වා ඇති ප්‍රමාණයට 2023 වර්ෂය සඳහා වෙළඳ බදු වශයෙන් අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**උප ලේඛන 01 -**

| අනු අංකය | බදු ස්වභාවය | වාර්ෂික වටිනාකම රු: 75,000.00 ට නොවැඩි | වාර්ෂික වටිනාකම රු: 150,000.00 ට නොවැඩි | වාර්ෂික වටිනාකම රු: 150,000.00 ට වැඩි |
|---|---|---|---|---|
| 01 | සිල්ලර බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 02 | ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 03 | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 04 | සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | පිත්තල බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 06 | ඇලුමිණියම් බඩු හා ප්ලාස්ටික් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 07 | ඔරලෝසු අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 08 | ලී බඩු වෙළඳ සැළක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 09 | පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 10 | ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 11 | යකඩ බඩු විකිණීමේ ස්ථානයත් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 12 | පාවිච්චි කරන ලද ඇඳුම් ගබඩා කර තබා ගැනීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 13 | ගුවන් විදුලි යන්ත්‍ර රූපවාහිණී යන්ත්‍ර වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 14 | රෙදි පිළි වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 15 | රෙකෝඩ් බාර් එකක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 16 | මහන මැෂින් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 17 | බයිසිකල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 18 | සිංහල බෙහෙත් බඩු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 19 | ඉංග්‍රිසි බෙහෙත් අළෙවි කිරීමේස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 20 | ලිපි ද්‍රව්‍ය, පොත් පත්,සඟරා (පාසල් උපකරණ) වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 21 | දුම්වැටි වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 22 | මැටි භාණ්ඩ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 23 | බුලත් පුවක් දුම්කොළ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 24 | විදුලි උපකරණ අලෙවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 25 | මත් පැන් හා රට බීම වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 26 | දුරකථන අලෙවි කිරීමේ හා අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 27 | පැළ තවානක් පවත්වාගෙන යාම හා විසිතුරු පැළ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 28 | ක්ෂණික ඡායා පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 29 | පෞද්ගලික දුරකථන ව්‍යාපාරයක් (කොමියුනිකේෂන්) පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 30 | මසා නිම කළ ඇදුම් (නිමි ඇදුම්) විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම. | 360.00 | 1,200.00 | 3,000.00 |
| 31 | ගීත පටිගත කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 32 | පින්තූර රාමු කරන ස්ථානයන් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 33 | ලිපි ද්‍රව්‍ය රබර් සීල් කැපීම හා රථ වාහන තහඩු පෑස්වීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 34 | විදේශ රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 35 | ක්‍රීඩා හා සමාජ ශාලාවක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 36 | බ්ලොක් ගල් , මල් පෝච්චි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 37 | ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 38 | ටයර් ටියුබ් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 39 | දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 40 | උත්සව භාණ්ඩ කුලියට දීමේ ස්ථානයන් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 41 | වාහන විකුණුම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 42 | ශීතකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 43 | පොහොර වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 44 | තීන්ත වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම. | 360.00 | 1,200.00 | 3,000.00 |
| 45 | පාපැදි ත්‍රීවිල් යතුරුපැදි අමතර කොටස් වෙළූදාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 48 | ස්වර්ණාභරණ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 49 | කෘෂි රසායනික බෙහෙත් අලෙවි කරන ස්ථානයන් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 50 | බැංකු සේවා (මූල්‍ය ආයතන) පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 51 | ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 52 | උකස් සේවා සපයන ස්ථාන පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 53 | කල්බදු සේවා සපයන ස්ථාන පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 54 | විසිතුරු මසුන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 55 | ඩිජිටල් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 56 | විසිතුරු භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 57 | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 58 | දුරකථන ජාල මධ්‍යස්ථාන පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 59 | ඉරිඟු අලෙවි කිරීමේ ස්ථාන පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 60 | වීදුරු අලෙවිසැල් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 61 | පරිගනක පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම. | 360.00 | 1,200.00 | 3,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 62 | කායවර්ධන පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම. | 360.00 | 1,200.00 | 3,000.00 |
| 63 | සංගීත භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 360.00 | 1,200.00 | 3,000.00 |
| 64 | රේස් ඔට්ටු හලක් පවත්වාගෙන යාම. | 360.00 | 1,200.00 | 3,000.00 |
| 65 | ඡායාරූප ගැනීම හා ඡායාරූප මුද්‍රණ ආයතනයක් පවත්වාගෙන යාම. | 360.00 | 1,200.00 | 3,000.00 |
| 66 | උපකාරක පංති පැවැත්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 360.00 | 1,200.00 | 3,000.00 |
| 67 | සිනමා ශාලාවක් පවත්වාගෙන යාම. | 360.00 | 1,200.00 | 3,000.00 |
| 69 | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 360.00 | 1,200.00 | 3,000.00 |
| 70 | ලිහිසි තෙල් හා ඔයිල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම් | 360.00 | 1,200.00 | 3,000.00 |
| 71 | ප්‍රවාහන පහසුකම් සැපයීම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 72 | විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 73 | සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 74 | පුවත්පත් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 75 | ජෝතිශ්‍යය ආයතනයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 76 | යන්ත්‍රෝපකරණ හා මෝටර් රථ කුලියට දීම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 77 | බෝකර් ස්ථාන පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 78 | සෙරමික් භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 79 | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 80 | සහල් ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 81 | ළඳරු නිෂ්පාදන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 82 | වෙනත් විවිධ ව්‍යාපාර | 360.00 | 1,200.00 | 3,000.00 |
| 83 | ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 84 | විදුලි උපාංග අලෙවි කිරීම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 85 | දුරකථන සම්ප්‍රේෂණ කුළුණු පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |
| 86 | පානීය ජලය අලෙවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 360.00 | 1,200.00 | 3,000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

12. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147(1) වගන්තිය යටතේ ලැබී ඇති බලය අනුව එම පනතේම 149 වගන්තිය ප්‍රකාරව හා මෙම සභාව විසින් 2017.10.04 දින තීරණ අංක 234 යටතේ පිළිගෙන 2017.06.09 දිනැති අංක 2023 ගැසට් පත්‍රය මඟින් පිළිගන්නට යෙදුණු 1952 අංක 06 දරණ (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ I වන උප වගන්තිය ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයා විසින් සාදා ඇති අතුරු ව්‍යවස්ථා මාලාවන්ට යටත්ව සහ අතිවිශේෂ ගැසට්පත් අංක 570/7 දරණ 1988.08.23 දිනැති ගැසට් පත්‍රය මඟින් පළ කෙරෙන්නට යෙදුණු සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 39 වන අතුරු ව්‍යවස්ථාවේ නිරූපිත ස්ථාන වෙනුවෙන්, එම ස්ථානයන්හි පහත සඳහන්

කරුණු මත 2023 වර්ෂය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමටත්, ඒ සඳහා පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු අය කිරීම සඳහාත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

(අ) ස්ථානයේ වාර්ෂික වටිනාකම.

(ආ) ඒ වෙළඳ ව්‍යාපාරයේ පිරිවැටුම.

(ඇ) ඒ වෙළඳ ව්‍යාපාරයෙන් උපයනු ලැබිය හැකි ලාභය.

(ඈ) ඒ වෙළඳ ව්‍යාපාරය මඟින් සපයනු ලබන බඩුවල හෝ සේවාවල අත්‍යාවශ්‍ය ස්වභාවය

**උප ලේඛන 01 -**

| | ව්‍යාපාර ස්වභාවය | වාර්ෂික වටිනාකම රුː750 ට නොවැඩි | වාර්ෂික වටිනාකම රුː750 සිට රුː1500දක්වා | වාර්ෂික වටිනාකම රුː1500 ට වැඩි |
|---|---|---|---|---|
| 01 | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 02 | මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 04 | කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබාර් සාප්පු, සැලුන් හා රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 05 | බේකරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 06 | කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 07 | පිහිනුම් තටාක පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 08 | අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 09 | බත් කඩ, ආපනශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | හෝටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 11 | නවාතැන් පොළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12 | ලොන්ඩරි පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | කර්මාන්ත ශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 14 | අවමංගල්‍ය සේවා සැපයීම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | සංචාරක වෙළඳුන් විසින් ආහාරපාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 16 | ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන<br>I. සිමෙන්ති විකිණීම.<br>II. කලු ගල්, ගල් කුඩු විකිණීම<br>III. වැලි, බොරළු විකිණීම.<br>IV. ගඩොල් විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 17 | අප්‍රසන්න හෝ අන්තරාදායක ව්‍යාපාර<br>I. කබොක්, බොරළු, හෝ කළු ගල් වලක් පවත්වාගෙන යාම හෝ විකිණීම.<br>II. කළුගල් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම.<br>III. වී මෝලක් හෝ ධාන්‍ය තුනපහ ඇඹරුම්හලක් පවත්වාගෙන යාම.<br>IV. පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම.<br>V. වාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම. (සර්විස් සෙන්ටර්)<br>VI. ලී මෝලක් හෝ වඩුමඩුවක් පවත්වාගෙන යාම<br>VII. ගෑස් ගබඩා කර තබා ගැනීම හා අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | VIII. ගවගාල් පවත්වාගෙන යාම<br>IX. සාතකාගාර පවත්වාගෙන යාම<br>X. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම<br>XI. කම්හලක් පවත්වාගෙන යාම<br>XII. තොග වශයෙන් සීනි, පිටි, ලූණු (හොන්ඩර 15ට වැඩි) ප්‍රමාණයක් ගබඩා කිරීම හෝ විකිණීම<br>XIII. තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු ආහාර ද්‍රව්‍ය, සුළු කෑම වර්ග විකිණීම<br>XIV. වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම<br>XV. ධාන්‍ය වර්ග, තුනපහ වර්ග අළෙවි කිරීම<br>XVI. ශීතකරණ අලුත්වැඩියා කරන ස්ථාන පවත්වාගෙන යාම<br>XVII. මෝටර් රථ, මෝටර් සයිකල්, පාපැදි, ත්‍රීවිල් අලුත්වැඩියා කරන ස්ථාන පවත්වාගෙන යාම<br>XVIII. සත්ව ආහාර අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම<br>XIX. සිසිල් බීම අලෙවි කිරීම<br>XX. මුදවපු කිරි, කිරි යෙදූ කෑම වර්ග අලෙවි කිරීම හා ගබඩා කිරීම<br>XXI. රස කැවිලි වර්ග නිෂ්පාදනය හා අලෙවි කිරීම<br>XXII. පලතුරු හා එළවළු වෙළඳාම් කිරීම<br>XXIII. වියළි ආහාර ඇසුරුම් කරන හා අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම<br>XXIV. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | | | |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>අතුරු ව්‍යවස්ථාව වෙනස් කර ගැනීමට කටයුතු සිදු කිරීම සුදුසු බව දන්වා සිටින ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

13. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150(I) වගන්තිය මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව ඒ ඒ ස්ථානවල වාර්ෂික වටිනාකම පදනම් කර ගනිමින් පහත උපලේඛනයෙහි දක්වා ඇති ස්වභාවයේ කර්මාන්ත වෙතින් උපලේඛනයෙහි දක්වා ඇති ආකාරයට වෙළඳ බද්දක් 2023 වර්ෂය වෙනුවෙන් අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**උප ලේඛන 01 -**

| අනු අංකය | බදු ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. **750.00** ට නොවැඩි | වාර්ෂික වටිනාකම රු. **750.00** සිට රු. **1,500.00** දක්වා | වාර්ෂික වටිනාකම රු. **1,500.00** ට වැඩි |
|---|---|---|---|---|
| 01 | විදුලි උපකරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 02 | ප්ලාස්ටික් , වැල් හෝ භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් සඳහා | 500.00 | 750.00 | 1,000.00 |
| 03 | සුරුට්ටු නිපදවීම සඳහා | 500.00 | 750.00 | 1,000.00 |
| 04 | පැණි නිපදවීම සඳහා | 500.00 | 750.00 | 1,000.00 |
| 05 | රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන ගැනීම සඳහා | 500.00 | 750.00 | 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 06 | බීඩි නිපදවීම සඳහා | 500.00 | 750.00 | 1,000.00 |
| 07 | හුණු නිපදවීමට පෝරණුවක් පවත්වාගෙන යාම සඳහා | 500.00 | 750.00 | 1,000.00 |
| 08 | ගම් නිපදවීම | 500.00 | 750.00 | 1,000.00 |
| 09 | යන්ත්‍රානුසාරයෙන් ගඩොල් හෝ උළු නිපදවීම හා පිළිස්සීම | 500.00 | 750.00 | 1,000.00 |
| 10 | සෙල්ලම් බඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500.00 | 750.00 | 1,000.00 |
| 11 | තෙල් මෝලක් පවත්වාගෙන යාම සඳහා | 500.00 | 750.00 | 1,000.00 |
| 12 | කඩදාසි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සහ ගබඩාවක් පවත්වාගෙන යාම සඳහා | 500.00 | 750.00 | 1,000.00 |
| 13 | කොහු හෝ කෙඳි වර්ග නිපදවීම හෝ කොහු කෙඳි වර්ග වලින් සාදනු ලබන භාණ්ඩ නිපදවීම සඳහා | 500.00 | 750.00 | 1,000.00 |
| 14 | යන්ත්‍ර නොමැතිව ගඩොල් හෝ උළු නිපදවීම | 500.00 | 750.00 | 1,000.00 |
| 15 | යන්ත්‍රානුසාරයෙන් මෙට්ට නිපදවීම සඳහා | 500.00 | 750.00 | 1,000.00 |
| 16 | යන්ත්‍ර නොමැතිව හෝ යන්ත්‍රානුසාරයෙන් සපත්තු, පාවහන් නිපදවීම සඳහා | 500.00 | 750.00 | 1,000.00 |
| 17 | පාසල් බෑග්, ගමන් මළු, ආදිය නිපදවීම | 500.00 | 750.00 | 1,000.00 |
| 18 | හකුරු නිපදවීම | 500.00 | 750.00 | 1,000.00 |
| 19 | ගිණිකෙළි භාණ්ඩ නිෂ්පාදනය සඳහා | 500.00 | 750.00 | 1,000.00 |
| 20 | සබන් නිෂ්පාදනය කිරීම සඳහා | 500.00 | 750.00 | 1,000.00 |
| 21 | බුරුසු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1,000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

14. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වන මඟින් හා 2017.06.09 දිනැති අංක 2023 ගැසට් පත්‍රය මඟින් පිළිගන්නට යෙදුණු 1952 අංක 06 දරණ (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ I වන උප වගන්ති ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයා විසින් සාදා ඇති අතුරු ව්‍යවස්ථා මාලාවේ 13.14 අතුරු ව්‍යවස්ථාවන් මඟින් නිරූපිත හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි ස්ථානයන්ගෙන් අතුරු ව්‍යවස්ථා මාලාවන්හි සඳහන් පරිදි වෙළඳ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා එම ස්ථානයේ ප්‍රවර්තන වර්ෂයට පෙර වර්ෂයේ ආදායමින් 1% ක ප්‍රමාණයක් අය කර 2023 වර්ෂය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

15. 1987 අංක 15 දරණ පනතේ 146(1) වන උප වගන්තිය යටතේ තිස්සමහාරාම ප්‍රාශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 392/20 හා 1986.03.04 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශ කර ඇත්තා වූ , ප්‍රදේශය ඇතුලත පිහිටියා වූ නිවාස වල, ගොඩනැගිලිවල, ඉඩම්වල,ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2007 වර්ෂය සඳහා වූ හා ප්‍රවර්ථන වර්ෂය 2023 වර්ෂය සඳහා සම්මත කළ යුතු බවටත්, එකී තක්සේරුව මත 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත යටතේ 134(1) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපල මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් 7% ක වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කළ යුතු බවටත්,

තවද 2023 වර්ෂයෙන් පහත සඳහන් එක් එක් කාර්තු වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර වාර්ෂික වරිපනම් බද්ධ තිස්සමහාරාම ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත් , එලෙස වාර්ෂික වරිපනම් බද්ධ 2023 වර්ෂයේ ජනවාරි 31 දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම්, වාර්ෂික වරිපනම් බද්දෙහි ප්‍රමාණයෙන් 10% ක වට්ටමක් ද එකී උප ලේඛනයේ එක් එක් කාර්තුව ඉදිරියෙහි 3 වන තීරයේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම්, එක් කාර්තුවකට අදාළ මුදලින් 5 % ක වට්ටමක් ද තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

**උප ලේඛන 01**

| කාර්තුව | ගෙවිය යුතු දිනය | %5වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය |
|---|---|---|
| පළමු කාර්තුව | 2023.03.31 | 2023.01.31 |
| දෙවන කාර්තුව | 2023.06.30 | 2023.04.30 |
| තුන් වන කාර්තුව | 2023.09.30 | 2023.07.31 |
| හතරවන කාර්තුව | 2023.12.31 | 2023.10.31 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

16. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු පහත දැක්වෙන ක්‍රීඩාපිටි හා හිස් භූමි බදු පදනම යටතේ කෙටි කාලයක් සඳහා බදු දීම වෙනුවෙන්, 2023 වර්ෂය සඳහා ගාස්තු අය කර බදු දීමත්, මෙම ස්ථානවලින් කොටසක් ඉල්ලුම් කිරීමේදී එසේ ඉල්ලුම් කරන ප්‍රමාණයට සාපේක්ෂව ගාස්තු අය කිරීමත්, දෙබරවැව පොදු ක්‍රීඩාංගනය සහ පන්නෙගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගනය ක්‍රීඩා කටයුතුවලට හා මුදල් අය නොකරන ප්‍රජා කටයුතු වලදී, එම ගාස්තු අය නොකිරීම මත ලබා දීමටත්, දෙබරවැව පොදු ක්‍රීඩාංගනය මුදල් අය කර ලබා දෙන අවස්ථාවලදී ආරක්ෂිත ඇප තැන්පතුවක් ලෙස රු. 75,000.00 ක මුදලක් ද, පන්නෙගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගනය මුදල් අය කර ලබා දෙන අවස්ථාවලදී ආරක්ෂිත ඇප තැන්පතුවක් ලෙස රු. 25,000.00 ක මුදලක් ද, රඳවා ගෙන එම කටයුත්ත අවසානයේ ක්‍රීඩාංගනයට හානියක් නොවන අවස්ථාවලදී පමණක් තැන්පත් මුදල් නිදහස් කිරීමේ පදනම මත දෙබරවැව පොදු ක්‍රීඩාංගනය හා පන්නෙගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගනය ලබා දීමටත් , තිස්සමහාරාම ලොරි රථ නැවතුම්පල සම්පූර්ණ භූමියෙන් භාගයක අඩු ප්‍රමාණයක් ලබාදෙන අවස්ථා වලදී වර්ග අඩියක් රු.5 ලෙස ගණනය කර ලබා දීමටත්, මෙම ගරු සභාවට යෝජනා කරමි.

**උප ලේඛන 01**

| අනු අංකය | ස්ථානය | පෙර පැවති ගාස්තුව (දිනකට) | සංශෝධන ගාස්තුව |
|---|---|---|---|
| 01 | දෙබරවැව පොදු ක්‍රීඩාංගනය | රු. 15,000.00 (දිනකට) | 20,000.00 (දිනකට) |
| | දෙබරවැව පොදු ක්‍රීඩාංගනය සඳහා තැන්පතු මුදල (ක්‍රීඩාංගනය භාවිතා කිරීමේදී එම දේපළට හානියක් සිදු නොවුණු අවස්ථාවලදී පමණක් මෙම මුදල නිදහස් කෙරේ. | රු. 50,000.00 | රු. 75,000.00 |
| | දෙබරවැව පොදු ක්‍රීඩාංගනය ක්‍රීඩා කටයුතු වලදී රජයේ ආයතන හැර පෞද්ගලික ආයතන සඳහා ලබා දීම (ක්‍රීඩා කටයුතු සඳහා පමණක් බැවින්, තැන්පත් නොගෙවීමේ සහනදායි පදනම මත) | රු. 5,000.00 (දිනකට) | රු. 7,500.00 (දිනකට) |
| 02 | තිස්සමහාරාම ලොරි රථ නැවතුම්පොළ | රු. 10,000.00 (දිනකට) | රු. 10,000.00 (දිනකට) |
| 03 | සභාව ඉදිරිපිට හිස් භූමිය | රු. 3,000.00 (දිනකට) | රු. 3,000.00 (දිනකට) |
| 04 | තිස්සමහාරාම පොලිස් ස්ථානය ඉදිරිපිට භූමිය | රු. 2,000.00 (දිනකට) | රු. 2,000.00 (දිනකට) |
| 05 | තිස්සමහාරාම බස්නැවතුම්පොළ ඉදිරිපිට භූමිය | රු. 2,000.00 (දිනකට) | රු. 2,000.00 (දිනකට) |
| 06 | තිස්සමහාරාම පොදු වෙළඳපොළ ඉදිරිපිට භූමිය | රු. 3,000.00 (දිනකට) | රු. 3,000.00 (දිනකට) |
| 07 | දෙබරවැව පොළ භූමිය | රු. 2,000.00 (දිනකට) | රු. 2,000.00 (දිනකට) |
| 08 | පන්නෙගමුව පොළ භූමිය | රු. 2,000.00 (දිනකට) | රු. 2,000.00 (දිනකට) |
| 09 | පන්නගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගණය (ක්‍රීඩා නොවන වෙනත් ඕනෑම මුදල් අය කරමින් සිදු කරන ඕනෑම කටයුත්තක් සැණකෙලි, රැස්වීම්, සංගීත ප්‍රසංග ආදී) | රු. 10,000.00 (දිනකට) | රු. 20,000.00 (දිනකට) |
| | පන්නගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගණය ( මුදල් අය නොකර සිදු කරන ඕනෑම වැඩසටහනක් සඳහා) | රු. 25,000.00 (ඇප තැන්පතු) | රු. 25,000.00 (ඇප තැන්පතු) |
| | පන්නගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගණය ( ක්‍රීඩා නොවන වෙනත් ඕනෑම කටයුත්තක් සඳහා) | රු. 15,000.00 (ඇප තැන්පතු) | රු. 15,000.00 (ඇප තැන්පතු) |
| | පන්නගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගනය ක්‍රීඩා කටයුතු වලදී රජයේ ආයතන හැර පෞද්ගලික ආයතන සඳහා ලබා දීම (ක්‍රීඩා කටයුතු සඳහා පමණක් බැවින්, තැන්පත් නොගෙවීමේ සහනදායි පදනම මත) | – | රු. 5,000.00 (දිනකට) |

<u>ගාස්තු වැඩිවීමට හේතු</u>

- ❖ දෙබරවැව පොදු ක්‍රීඩාංගණය හා පන්නගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගණය නඩත්තු කටයුතු, තණකොළ කැපීම ආදී සංවර්ධන කටයුතු සිදු කිරීම නිසා දිනකට අය කරනු ලබන මුදල වැඩි කර ඇත.
- ❖ දෙබරවැව පොදු ක්‍රීඩාංගණය නිරන්තරයෙන් ක්‍රීඩා කටයුතු සඳහා යොදා ගන්නා ක්‍රීඩාංගණයක් බැවින්, භූමිය බදු දීමේදී එම භූමියට හානි සිදු වුව හොත්, එම හානිය පියවා ගැනීමට තැම්පත් මුදලක් අය කරයි. එහිදී නඩත්තු කටයුතු සඳහා යන වාහන මිළට ගැනීමේ

ගාස්තු හා නඩත්තු කටයුතු සඳහා යොදා ගනු ලබන ද්‍රව්‍යවල මිළ ගණන් ඉහළ යාම නිසා දෙබරවැව පොදු ක්‍රීඩාංගණය තැම්පත් මුදල රු. 75,000.00 ලෙස සංශෝධනය කර ඇත.

❖ ලොරි රථ නැවතුම්පල සම්පූර්ණ වර්ග අඩි ප්‍රමාණය 18220 වන අතර, මින් පෙර භූමියෙන් භාගයකට අඩු ප්‍රමාණයක් ලබා දීමේදී 18220/10000=1.82 ලෙස ලබා දී තිබුනද මේ වන විට නඩත්තු වියදම් අධික වීම හේතුවෙන් වර්ග අඩියක් සඳහා අයකරන මුදල ස්ථාවර මුදලක් ලෙස සංශෝධනය කර ඇත.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.ඩබ්. නන්දා මහත්මිය විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

17. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු පන්නෙගමුව සති පොළෙහි ගාස්තු 2023 වර්ෂය තුලදී පහත දැක්වෙන ආකාරයට අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**උප ලේඛන 01 -**

| | පෙර පැවති ගාස්තුව (දිනකට) | සංශෝධන ගාස්තුව |
|---|---|---|
| ඩබල් වීල් ලොරි රථ සඳහා | රු. 250.00 | රු. 300.00 |
| සිංගල් වීල් ලොරි රථ සඳහා | රු. 150.00 | රු. 175.00 |
| කුඩා ප්‍රමාණයේ ලොරි රථ සඳහා (බඩී) | රු. 100.00 | රු. 120.00 |
| අඩි 10x8ප්‍රමාණයේ කඩ අල්ලි | රු. 60.00 | රු. 80.00 |
| අඩි 10x5ප්‍රමාණයේ කඩ අල්ලි | රු. 40.00 | රු. 60.00 |
| අඩි 8x5ප්‍රමාණයේ කඩ අල්ලි | රු. 30.00 | රු. 50.00 |
| මාලු ලැල්ලක් සඳහා | රු. 80.00 | රු. 100.00 |
| අඩි 4x4කඩ පිල් | රු. 20.00 | රු. 20.00 |

<u>ගාස්තු වැඩිවීමට හේතු</u>

❖ සති පොළවල්වල ජල , විදුලි පහසුකම් ආදී පහසුකම් මෙන්ම පොළ භූමියේ කසළ ඉවත් කිරීමේ කටයුතු සිදු කරමින් ගොවි ජනතාවට මෙන්ම වෙළඳුන් වෙත පහසුකම් ලබා දීම සිදු කරයි. එම පහසුකම් ලබා දීමේ ගාස්තු ඉහළ යාම නිසා හා ඉන්ධන මිළ ඉහළ යාම නිසා කසළ ඉවත් කිරීමටද වැඩි මුදලක් යෙදවීමට සිදු වේ . එම නිසා ඊට සාපේක්ෂව පන්නගමුව සති පොළෙහි ගාස්තු සංශෝධනය සිදු කර ඇත.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

18. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු දෙබරවැව සති පොළෙහි ගාස්තු 2023 වර්ෂය තුලදී පහත දැක්වෙන ආකාරයට අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

උප ලේඛන 01 -

| | පෙර පැවති ගාස්තුව (දිනකට) | සංශෝධන ගාස්තුව |
|---|---|---|
| අඩි 9x5 ප්‍රමාණයේ කඩ අල්ලි | රු. 80.00 | රු. 100.00 |
| අඩි 6x5 ප්‍රමාණයේ කඩ අල්ලි | රු. 50.00 | රු. 60.00 |
| අඩි 7 1/2x5 ප්‍රමාණයේ කඩ අල්ලි (ගොඩනැගිල්ල ඇතුළත) | රු. 150.00 | රු. 150.00 |
| මාලු ලැල්ලක් සඳහා | රු. 200.00 | රු. 200.00 |

<u>ගාස්තු වැඩිවීමට හේතු</u>

- ❖ සති පොළවල්වල ජල , විදුලි පහසුකම් ආදී පහසුකම් මෙන්ම පොළ භූමියේ කසළ ඉවත් කිරීමේ කටයුතු සිදු කරමින් ගොවි ජනතාවට මෙන්ම වෙළඳුන් වෙත පහසුකම් ලබා දීම සිදු කරයි. එම පහසුකම් ලබා දීමේ ගාස්තු ඉහළ යාම නිසා හා ඉන්ධන මිළ ඉහළ යාම නිසා කසළ ඉවත් කිරීමටද වැඩි මුදලක් යෙදවීමට සිදු වේ . එම නිසා ඊට සාපේක්ෂව දෙබරවැව සති පොළෙහි ගාස්තු සංශෝධනය සිදු කර ඇත.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

19. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122 හා 126 vii ඊ වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ 527/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ iv (ආ) කොටස මගින් ප්‍රසිද්ධ කරන ලද 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වන වගන්තියේ 01 වන උප වගන්තිය අනුව, විෂය භාර අමාත්‍යවරයා විසින් පනවා ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 39 වන අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව 2023 වර්ෂය සඳහා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කෙරෙන දැන්වීම් පුවරු සඳහා පහත දැක්වෙන ගාස්තු නියමයන් අනුව, දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

උප ලේඛන 01 -

- ❖ පවත්නා වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට රු. 100.00 බැගින් වූ ගාස්තුවක්.
- ❖ රෙදි හෝ ඉටි රෙදි භාවිතා කරනු ලබන දැන්වීමක් සඳහා මාසයක් හෝ ඉන් කොටසක් සඳහා වර්ග අඩියකට රු. 30.00 බැගින් වූ ගාස්තුවක්.
- ❖ කඩදාසියේ මුද්‍රිත දැන්වීමක් මාසයක් හෝ ඉන් කොටසක් ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට රු. 5.00 බැගින් වූ ගාස්තුවක්
- ❖ පවත්නා වර්ෂයේ දෙසැම්බර් මස 31 දින දක්වා, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඩිජිටල් දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියකට රු. 1,500.00 බැගින් වූ ගාස්තුවක් අය කිරීම.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, චතුමිණි විජේනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

20. විනෝද බදු මුදල් ආඥා පනතේ 2 වන වගන්තියේ i වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශයන්හි පවත්වනු ලබන විනෝද කටයුත්තකට ඇතුළත් වීම සඳහා කරන ලද ගෙවීම් වලින් පහත දැක්වෙන ආකාරයට 2023 වර්ෂයට විනෝද බදු අය කිරීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

උප ලේඛන 01 -

- ❖ ප්‍රේක්ෂකයන්ගෙන් මුදල් අය කර ප්‍රදර්ශනය කරනු ලබන චිත්‍රපට සංදර්ශනයක් සඳහා සියයට හතයි දශම පහක (7.5%) විනෝද බද්දක් පැනවීම.
- ❖ මුදල් අය කොට, පවත්වනු ලබන සංගීත සංදර්ශන හෝ වෙනත් ඕනෑම විනෝද කටයුත්තක් සඳහා සියයට විස්සක (20%) බද්දක් පැනවීම.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

21. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ සහ කිරින්ද රථවාහන නැවතුම්පොළ සඳහා පහත දැක්වෙන පරිදි, 2023 වර්ෂයට ගාස්තු අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

උප ලේඛන **01** -

❖ **තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ**

| | පෙර පැවති ගාස්තුව (දිනකට) | සංශෝධන ගාස්තුව |
|---|---|---|
| ලොරි රථ, බස් රථ සඳහා | රු. 60.00 | රු. 100.00 |
| වෑන් රථ සඳහා | රු. 50.00 | රු. 80.00 |
| මෝටර් රථ සඳහා | රු. 40.00 | රු. 50.00 |
| ත්‍රීවිල් රථ සඳහා | රු. 20.00 | රු. 30.00 |

❖ **කිරින්ද රථවාහන නැවතුම්පොළ**

| | පෙර පැවති ගාස්තුව (දිනකට) | සංශෝධන ගාස්තුව |
|---|---|---|
| ලොරි රථ, බස් රථ සඳහා | රු. 60.00 | රු. 100.00 |
| වෑන් රථ සඳහා | රු. 50.00 | රු. 80.00 |
| මෝටර් රථ සඳහා | රු. 40.00 | රු. 50.00 |
| ත්‍රීවිල් රථ සඳහා | රු. 20.00 | රු. 30.00 |

ගාස්තු වැඩිවීමට හේතු

❖ රථ වාහන නැවතුම්පලවල්වල කසළ ඉවත් කිරීමේ කටයුතු සිදු කිරීම මෙන්ම, අවශ්‍ය අවස්ථාවන්වල සංවර්ධන කටයුතු (බොරළු ඇතිරීම, රථවාහන නැවතුම්පලේ වලවල් සඳහා පස් දැමීම) සිදු කරමින්, සංචාරකයින් වෙත පහසුකම් ලබා දීම සිදු කරයි.තවද, වීථි ලාම්පු අළුතින් සවිකර මාර්ග දෙපස ආලෝකය සපයා ඇති අතර ඒ සඳහා වීථි ලාම්පු වියදම පෙර මෙන් දෙගුණයකින් ඉහල ගොස් ඇත. කසළ ඉවත් කිරීමේ පහසුකම් ලබාදීම සඳහා වන ඉන්ධන මිළ ඉහළ යාම නිසා හා සංවර්ධන කටයුතු සඳහා වන ගාස්තු වැඩි වීම නිසා ඊට සාපේක්ෂව රථ වාහන නැවතුම්පලවල්වල ගාස්තු සංශෝධනය සිදු කර ඇත.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික එම්.එල්.එම්. හනීෆා මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

22. 2023 වර්ෂයේදී තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු තිස්සමහාරාම මහසෙන්පුර ආදාහනාගාරයේ ආදාහනයක් සිදු කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම පහත දැක්වෙන ලෙසට විය යුතු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි .

උප ලේඛන 01

❖ තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වූ මෘත දේහයක් ආදාහනය කිරීම වෙනුවෙන් ගාස්තුව - රු. 18,400.00

❖ තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත වූ මෘත දේහයක් ආදාහනයක් සිදු කිරීම වෙනුවෙන් ගාස්තුව - රු. 20,000.00

ගාස්තු වැඩිවීමට හේතු

➢ මාසයන කාලයක් ආදාහනාගාරයේ මෘත දේහ ආදාහනය කිරීමේ කටයුතු අධීක්ෂණය කරමින් මිළ ගණන් සංශෝධනය සිදු කර ඇත.

| | |
|---|---|
| මසකට අවම වශයෙන් ආදාහනය කරන මෘත දේහ ගණන | 24 |
| මෘත දේහ 24 ක් ආදාහනය සඳහා ගෑස් වැය වන ප්‍රමාණය | 874 kg |
| 37.5 kg ගෑස් සිලින්ඩරයක ගෑස් බර | 23.3 kg |
| 37.5 kg ගෑස් සිලින්ඩරයක මිළ | රු. 18,500.00 |
| මෘත දේහ ආදාහනය සඳහා ගෑස් සඳහා මාසයකට යන ලද වියදම | රු. 431,050.00 |
| ආදාහනාගාර ක්‍රියාකරු, සහායක සඳහා වැටුප්, අතිකාල හා දීමනා මසකට | රු. 10,000.00 |
| මෘත දේහ 24ක් ආදාහනය සඳහා වන මුළු වියදම | රු. 441,050.00 |
| **එක් මෘත දේහයක් ආදාහනය සඳහා වන වියදම** | **18377.00** |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

23. තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික ස්ථාන වලින් කසළ ඉවත් කිරීමේ සේවාව වෙනුවෙන් පහත දැක්වෙන පරිදි 2023 වර්ෂය සඳහා ගාස්තු අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**උප ලේඛන 01**

| | පෙර පැවති ගාස්තුව (දිනකට) | සංශෝධන ගාස්තුව |
|---|---|---|
| කාමර 04 ක් හෝ ඊට අඩු දිනකට | රු. 500.00 | රු. 650.00 |
| කාමර 05-10 ත් අතර දිනකට | රු. 650.00 | රු. 800.00 |
| කාමර 11-15 ත් අතර දිනකට | රු. 750.00 | රු. 900.00 |
| කාමර 16-20 ත් අතර දිනකට | රු. 800.00 | රු. 1,000.00 |
| කාමර 21-25 ත් අතර දිනකට | රු. 1,000.00 | රු. 1,250.00 |
| කාමර 26 හෝ ඊට වැඩි දිනකට | රු. 1,500.00 | රු. 2,000.00 |
| වෙනත් ව්‍යාපාරික ආයතන සඳහා දිනකට | රු. 500.00 | රු. 750.00 |

අවම වශයෙන් සතියකට දින 02 ක් කසළ ඉවත් කිරීමේ සේවාව ලබා ගත යුතුය.

<u>ගාස්තු වැඩිවීමට හේතු</u>

- කසළ ඉවත් කිරීම සඳහා යොදා ගනු ලබන කම්පැක්ටර් රථ 02 හා ටිපර් රථය, ට්‍රැක්ටර් රථය සඳහා වන ඉන්ධන සඳහා යන වියදම් හා අලුත්වැඩියා කටයුතු හා සේවා කිරීමට යන වියදම් වැඩිවීම නිසා කසළ ඉවත්කිරීමේ ගාස්තු සංශෝධනය කිරීම සිදු කර ඇත.
- හොටෙල්වලින් සතියකට දින 01 ක් කසළ ඉවත් කිරීමේ සේවාව ලබා ගැනීමෙන්, කසළ නරක් වී තිබීම හා දුඟඳ හැමීම නිසා කොම්පෝස්ට් නිශ්පාදනයට යොදා ගත නොහැකිවීම නිසා අවම වශයෙන් සතියකට දින 02 ක් කසළ ඉවත් කිරීමේ ගාස්තු ගෙවා සේවාව ලබා ගත යුතු බවට කොන්දේසියක් ඇතුළත් කර ඇත.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

24. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු රථවාහන බදු දීම වෙනුවෙන් පහත සඳහන් පරිදි 2023 වර්ෂය සඳහා ගාස්තු අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**උප ලේඛන 01**

| අනු අංකය | රථවාහන වර්ගය | පෙර පැවති ගාස්තුව | සංශෝධන ගාස්තුව |
|---|---|---|---|
| 01 | මෝටර් ග්‍රේඩරය | රු. 6,000.00 මීටර් පැයකට | රු. 8,000.00 මීටර් පැයකට |
| 02 | බැකෝ යන්ත්‍රය | රු. 3,750.00 මීටර් පැයකට | රු. 5,500.00 මීටර් පැයකට |

| | | | |
|---|---|---|---|
| 03 | ටොන් 8-10 වයිබ්‍රේටිං රෝල | රු. 4,800.00 මීටර් පැයකට | රු. 5,500.00 මීටර් පැයකට |
| 04 | කියුබ් 2 ½ ටිපර් රථය | රු. 15,000.00 දිනකට | රු. 18,000.00 දිනකට |

<u>ගාස්තු වැඩිවීමට හේතු</u>

➢ මෝටර් ග්‍රේඩරය හා බැකෝ ලෝඩරය බල ප්‍රදේශයේ ලබා දෙන මිළ ගණන් වන්නේ,

මෝටර් ග්‍රේඩරය - රු. 8,500.0

බැකෝ ලෝඩරය - රු. 6,000.00

➢ මෝටර් ග්‍රේඩරය මී. පැ. 01 සඳහා ඩීසල් සඳහා අවශ්‍ය ඉන්ධන - 8.5 ලීටර්
මී. පැ. 01 සඳහා ඩීසල් සඳහා වියදම - 8.5 x 430.00
- **3655.00**

අමතර කොටස් හා සේවා කිරීම්, ඔයිල් දැමීමට වියදම් අධික වීම නිසා හා බල ප්‍රදේශයේ මෝටර් ග්‍රේඩරයක් ලබා දෙන මුදලට සාපේක්ෂව සභාව විසින් එම මුදලට වඩා සුළු මුදලක් අඩු කරමින් මෝටර් ග්‍රේඩරය සඳහා ගාස්තුව සංශෝධනය කර ඇත.

❖ බැකෝ ලෝඩරය මී. පැ. 01 සඳහා ඩීසල් සඳහා අවශ්‍ය ඉන්ධන - 8 ලීටර්
මී. පැ. 01 සඳහා ඩීසල් සඳහා වියදම - 8 x 430.00
- **3440.00**

අමතර කොටස් හා සේවා කිරීම්, ඔයිල් දැමීමට වියදම් අධික වීම නිසා හා බල ප්‍රදේශයේ බැකෝ ලෝඩරය ලබා දෙන මුදලට සාපේක්ෂව සභාව විසින් එම මුදලට වඩා සුළු මුදලක් අඩු කරමින් බැකෝ ලෝඩරය සඳහා ගාස්තුව සංශෝධනය කර ඇත.

❖ ඉන්ධන මිළ වැඩිවීම හා වාහන අමතර කොටස් මිළ, සේවා කිරීම් ගාස්තු වැඩිවීම හේතුවෙන් රථ වාහන සඳහා ගාස්තු වැඩි කර ඇත.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

25. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ලීටර් 6000 (60001) ජල බවුසරයේ සේවාව ලබා දීම සම්බන්ධව පහත දැක්වෙන පරිදි, 2023 වර්ෂය සඳහා ගාස්තු අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**උප ලේඛන 01**

| | පෙර පැවති ගාස්තුව | සංශෝධන ගාස්තුව |
|---|---|---|
| පළමු කිලෝ මීටර් 01 සිට කිලෝ මීටර් 30 දක්වා | රු. 2,900.00 | රු. 3,500.00 |
| පළමු කි.මී. 30 සිට වැඩි වන සෑම කිලෝ මීටරයකටම | රු. 90.00 | රු. 120.00 |

ගාස්තු වැඩිවීමට හේතු

- ❖ ඉන්ධන මිළ වැඩිවීම හා වාහන අමතර කොටස් මිළ, සේවා කිරීම් ගාස්තු වැඩිවීම හේතුවෙන් රථ වාහන සඳහා ගාස්තු වැඩි කර ඇත.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජ්. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

26. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ලීටර් 8000 (8000l) ජල බවුසරයේ (ගිණි නිවීමට හැකි වන පරිදි සකස් කර ඇති) සේවාව ලබා දීම සම්බන්ධව පහත දැක්වෙන පරිදි, 2023 වර්ෂය සඳහා ගාස්තු අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**උප ලේඛන 01**

| | පෙර පැවති ගාස්තුව |
|---|---|
| බල ප්‍රදේශය ඇතුළත බවුසරය ලබා දීම (දිනකට) | රු. 15,000.00 |
| බල ප්‍රදේශයෙන් පිටත බවුසරය ලබා දීම (දිනකට) | රු. 20,000.00 |

සංශෝධිත කොටස

අමතර ජල බවුසර් ලබා ගන්නේ නම්,

- ➢ එක් ජල බවුසරයකට රු. 250.00 බැගින් හා පළමු කිලෝ මීටර් 01 සිට කිලෝ මීටර් 50 දක්වා - රු. 1,000.00
- ➢ කි.මී. 50 සිට වැඩි වන සෑම කිලෝ මීටරයකටම - රු. 120.00

ගාස්තු වැඩිවීමට හේතු

- ❖ ඉන්ධන මිළ වැඩිවීම හා වාහන අමතර කොටස් මිළ, සේවා කිරීම් ගාස්තු වැඩිවීම හේතුවෙන් රථ වාහන සඳහා ගාස්තු වැඩි කර ඇත.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික චමින්ද ඩයස් වන්නිගේ මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

27. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ගලි බවුසරයේ සේවා ලබා දීම සම්බන්ධව පහත දැක්වෙන පරිදි, 2023 වර්ෂය සඳහා ගාස්තු අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**උප ලේඛන 01**

| අනු අංකය | | පෙර පැවති ගාස්තුව | සංශෝධන ගාස්තුව |
|---|---|---|---|
| I. | එක් බවුසරයක් ඉවත් කිරීම තිස්සමහාරාම ප්‍රදේශය තුළ නේවාසික ස්ථානයක | රු. 3,000.00 | රු. 3,000.00 |

| | | | |
|---|---|---|---|
| II. | තිස්සමහාරාම ප්‍රදේශය තුළ වාණිජ ස්ථානයකළුක් බවුසරයක් ඉවත් කිරීම සඳහා | රු. 5,000.00 | රු. 5,000.00 |
| III. | තිස්සමහාරාම ප්‍රදේශයෙන් පිටතනේවාසික හෝ වාණිජ ස්ථානයක එක් බවුසරයක්ඉවත් කිරීම සඳහා | රු. 5,500.00 | රු. 5,500.00 |
| IV. | මීට අමතරව ඉවත් කරන සෑම බවුසර්එකක් සඳහා නේවාසික | රු. 2,000.00 | රු. 2,000.00 |
| | වාණිජ | රු. 3,000.00 | රු. 3,000.00 |
| V. | ප්‍රවාහන ගාස්තුව - පළමු කිලෝ මීටර් 30 ක් දක්වා | රු. 2,800.00 | රු. 3,225.00 |
| VI. | කිලෝ මීටර් 30 වැඩි වන සෑම කිලෝ මීටර් එකකට | රු. 100.00 | රු. 120.00 |
| VII. | අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ස්ථානයක් සපයා නොදෙන විට | රු. 1,000.00 | රු. 1,000.00 |

<u>ගාස්තු වැඩිවීමට හේතු</u>

- V. යටතේ ප්‍රවාහන ගාස්තු වැඩි කර ඇත.
  ගලි බවුසරය 4 km ධාවනය සඳහා ඩීසල් ලීටර් 01 ක් වැයවේ.
  පළමු 30 km සඳහා ඩීසල් ලීටර් 7.5 ලීටර් අවශ්‍ය වේ. ඒ සඳහා මුදල - 3,225.00
  ඒ අනුව එම මුදල 3,225.00 ලෙස සංශෝධනය කර ඇත.
- Vi යටතේ වැඩි වන සෑම 1 km සඳහාම මුදල රු. 120.00 ලෙස සංශෝධනය කර ඇත. 1 km ධාවන සඳහා වැය වන මුදල 107.50 කි. ඔයිල් සඳහා වන මුදල සමඟ රු. 120.00 කි.
  ගලි බවුසරය 4 km ධාවනය සඳහා ඩීසල් ලීටර් 01 ක් වැයවේ.
  1 km වැය වන මුදල - 430.00 / 4
  - **107.50**

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

28. **(I)** තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු වැසිකිළි හා නාන ස්ථාන සඳහා පහත දැක්වෙන පරිදි 2023 වර්ෂය සඳහා ගාස්තු අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**උප ලේඛන 01**

| අනු අංකය | ස්ථානය | අය කරන ලද මුදල (රු) |
|---|---|---|
| 01 | කිරින්ද පූජා නගර පැරණි වැසිකිළිය සහ නව වැසිකිළිය | එක් පුද්ගලයෙකුගෙන් රු. 30.00 ක මුදලක් අය කරනු ලබයි |
| 02 | කිරින්ද වෙරළ වැසිකිළිය | |
| 03 | තිස්ස පූජා නගර වැසිකිළිය | |
| 04 | පන්නෙගමුව පොදු වැසිකිළිය | |
| 05 | තිස්ස බස්නැවතුම්පොළ නව වැසිකිළිය | |
| 06 | අකුරුගොඩ හන්දියේ වැසිකිළිය | |
| 07 | දෙබරවැව පොදු වෙළඳපොළ වැසිකිළිය | |

| | | |
|---|---|---|
| 09 | කිරින්ද වෙරළ වැසිකිළියේ නාන ස්ථානය සඳහා | එක් පුද්ගලයෙකුගෙන් රු. 40.00 ක මුදලක් අය කරනු ලබයි |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(II)** තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් පොහොර අලෙවි කිරීමේ ගාස්තු පහත දැක්වෙන පරිදි 2023 වර්ෂය සඳහා අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| | | පෙර පැවති ගාස්තුව | සංශෝධන ගාස්තුව |
|---|---|---|---|
| කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 01 (01 kg) | | රු. 15.00 | රු. 25.00 |
| බෑග් සඳහා | 50 kg | රු. 40.00 | රු. 40.00 |
| | 25 kg | රු. 30.00 | රු. 30.00 |

<u>ගාස්තු වැඩිවීමට හේතු</u>

කොම්පෝස්ට් ටොන් 100 ක් පමණ වසරකට නිපදවනනිපදවන අතර, දැනට පවතින මිළ යටතේ විකිණීමෙන් ලක්ෂ 15 පමණ ආදායමක් ලබා ගත හැකි වුවද, කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ නඩත්තු කටයුතු සඳහා වන වියදම පහත පරිදි වේ.

- දෛනික කම්කරු වැටුප් - 150000.00 x 12
  - <u>1,800,000.00</u>
- අතිකාල සඳහා (80 x 2) - <u>203,520.00</u>
- සංග්‍රහ වියදම් - <u>42600.00</u>
- නඩත්තු සඳහා සාමානෘයයන් - <u>2,000,000.00</u>

<u>ඒ අනුව කොම්පෝස්ට් පොහොර විකිණීමෙන් අපේක්ෂිත ආදායමට වඩා වියදමක් දැරීමට සිදු වීම නිසා කොම්පෝස්ට් පොහොර 1kg මුදල රු. 25.00 දක්වා මිළ වැඩි කර ඇත.</u>

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

- **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.රජිත ප්‍රියදර්ශන මහතා</u>**

2023 වර්ෂය සඳහා ආදායම් ගැසට් කිරීමේ දී ඇතැම් ගාස්තු වැඩි වීමක් සිදු වී තිබුණත්, රට තුළ පවතින උද්දමනය නිසා මෙලෙස ගාස්තු වැඩි වීමට හේතු වී ඇති බැවින්, ආදායම් ගැසට් සම්බන්ධයෙන් අංක 11 සිට අංක 28 දක්වා වූ යෝජනා සඳහා විරුද්ධ නොවන බව ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ <u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>

• <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

29. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු වාහනවල භාවිතයෙන් ඉවත් කර ඇති පහත සඳහන් ටයර් තොග, රීබිල් කිරීමට හෝ ඩැක් කිරීමට සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

- 825 x 20 - 05
- 825 x 16 - 07
- 355 x 70 x 17.5 - 02
- 12.4 x 28 - 04
- 1300 x 24 - 03
- 750 x 16 - 10
- 900 x 20 - 02
- 600 x 16 - 06

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

30. කාවන්තිස්සපුර පෙර පාසල අලුත්වැඩියා කිරීමේ (දෙවන අදියර) සිදු කිරීම සඳහා සකස් කරන ලද රු. 1,258,019.31 කින් යුත් ඇස්තමේන්තුව අනුව, එකී ව්‍යාපෘතිය ඍජු ශ්‍රමික පදනම මත සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>2023 වසරේ ඉහත සඳහන් පෙර පාසල ආරම්භ කිරීමට කඩිනමින් කටයුතු සිදු කර, ළමුන් බඳවා ගැනීමට අදාළ අයදුම්පත් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට ප්‍රජා සංවර්ධන නිලධාරී වෙත උපදෙස් ලබා දෙන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

31. තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ වායු සමීකරණ යන්ත්‍ර 12 ක් වාර සේවා කිරීම සඳහා සේවා සපයන ආයතනයක් සමඟ ගිවිසුම් ගත වීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා</u>

වායු සමීකරණ යන්ත්‍ර සේවා කිරීමේ දී පිටත ප්‍රදේශවලින් සේවා කිරීමේ දී ඒ සඳහා ප්‍රවාහන ගාස්තුද ගෙවීමට සිදු වන බැවින්, එකී සේවා කිරීම තිස්සමහාරාමය අවට ආයතන වෙතින් සිදු කිරීම සුදුසු බවට දන්වා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

32. දෙබරවැව ඉමෙඩිරෝ ෆාමසිය අසලින් දෙබරවැව පොළ භූමියට ප්‍රවේශ වන මාර්ගය අලුත්වැඩියා කිරීම සඳහා රු. 657,360.00 කින් යුත් ඇස්තමේන්තුවට අදාළව එම කර්මාන්තය ඍජු ශ්‍රමික පදනම මත සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා</u>**

33. රණකෙලිය කොට්ඨාසයේ පසුගිය සමයේ ඉදි කරන ලද නිවාස යෝජනා ක්‍රම 07 සඳහා පානීය ජලය ලබා දීමට එම ගම්මාන හරහා දිවෙන ජල සම්පාදනයට අයත් නල මගින් පොදු ජලකරාම ගම්මානයකට 01 බැගින් ලබා දී, එය එම ගමේ ජනතාව විසින් මුදල් ගෙවීමේ පදනම මත දැනට ජල සම්පාදනය මගින් යෝධකණ්ඩිය දක්වා අලුතින් ලබා දෙන ජල සැපයුම්වලින් යම් ප්‍රමාණයක් ඉහත සඳහන් නිවාස යෝජනා ක්‍රම 07 සඳහා පොදු ජල කරාමයක් ලබා දෙන මෙන් තිස්සමහාරාම ජල සම්පදන මණ්ඩලයේ ස්ථාන භාර නිලධාරීතුමාට හා හම්බන්තොට ජල සම්පදන මණ්ඩලයේ වාණිජ නිලධාරීතුමා හා දකුණු පළාත් ජල සැපයුම් මණ්ඩලයේ ඉංජිනේරුතුමා වෙත මේ සම්බන්ධව ලිඛිත දැනුවත් කර ඉහත සඳහන් ජල අවශ්‍යතාවය ලබා ගැනීමට මැදිහත් වන ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා</u>**

මෙම ගම්මාන සඳහා පිවිසෙන ප්‍රධාන මාර්ගයන්හි ජල නළ එලීම් සිදු කර ඇති බැවින්, ජලය ලබා ගැනීමට පහසු වන බවත්, ජල ධාරිතාවය ලබා දීමට තරම් ප්‍රමාණවත් නොවන්නේ නම්, සතියකට එක් දිනක් වන ලෙසට ජලය ලබා දෙන ලෙසට ජල සම්පාදන මණ්ඩලයෙන් ඉල්ලීම් කළ යුතු බව දන්වා සිටින ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>කොට්ඨාසයන්හි පිහිටුවන ලද ලියාපදිංචි ප්‍රජා කමිටු හරහා ගම්මාන සඳහා පොදු ජල කරාම ලබා ගැනීමට කටයුතු සිදු කර, ඒ සඳහා වන බිල්පත් එම ප්‍රජා කමිටු මගින් ගෙවීම් කිරීමේ පදනම මත ලබා ගැනීම සුදුසු වන බව දන්වා සිටින ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා</u>**

34. තම කොට්ඨාසය තුළ හේන් ගොවිතැන් කරන ප්‍රධාන සුළු ගොවීන්ට මුහුණපෑමට සිදු වන ප්‍රධාන ගැටළු ලෙස වන අලි සම්බන්ධව සහ විදුලි වැට සම්බන්ධයෙන් අදාළ වගකිව යුතු සියලු ආයතනයන් වෙත (අදාළ ගැටළුව සම්බන්ධයෙන් 2010.07.01 වන දින පාර්ලිමේන්තු විවාද - හැන්සාඩ් වාර්තාව, 2014.09.03 දින දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයෙන් නිකුත් කළ ලිපිය, 2019.05.21 දින අප ගොවි බිම් කොකොවා වගා කිරීම සඳහා ඊශ්‍රාලයේ බිම් සමාගම යටතේ වගා කිරීමට දීම පිළිබඳව අමාත්‍ය මණ්ඩල තීරණ) ලිපි යොමු කරන ලද ලද බවත්, මෙවැනි ගැටළු සාකච්ඡා කරන ලද රැස්වීම්වලදී ගොවි සංවිධාන ගැටළු නිර්මාණය වී අසත්‍ය තොරතුරු සපයන බවට දිගින් දිගටම ගොවි සංවිධාන නියෝජිතයින් වෙත දෝෂාරෝපණ එල්ල කිරීමෙන් ගොවීන්ට පැහැදිලි අසාධාරණයක් සිදු වී ඇති බැවින්, මේ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ <u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>

• <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා</u>

35. යෝධකණ්ඩිය දේවානන්ද මහා විද්‍යාලේ පන්ති කාමරයන්හි ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා අප ප්‍රදේශයේ 03 ශ්‍රේණියේ සහ 05 ශ්‍රේණියේ ඉගෙනුම ලබන දරුවන් දෙදෙනෙක් හට බෙරලිහෙල ප්‍රදේශයේ පාසලකට යාමට සිදු වී ඇති බවත්, මේ දිනවල පවතින ඉන්ධන ගැටලුවත් සමඟ බෙරලිහෙල වැනි දුර ප්‍රදේශයක එම දරුවන් දෙදෙනා රැගෙන යාමට එම දරුවන්ගේ පියාට නොහැකි වීම නිසා දරුවන් දෙදෙනාට මාස 03 ක් තිස්සේ නිවසේ රැඳී සිටීමට සිදුව ඇති බැවින්, එලෙසට අසරණ තත්ත්වයට පත්ව සිටින දරුවන් දෙදෙනා යෝධකණ්ඩිය විද්‍යහල සඳහා ඇතුළත් කර එම දරුවන් දෙදෙනා හට සාධාරණයක් ඉටු කර දීමට මැදිහත් වන ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම -**

❖ 2022.09.02 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.09.02 වන දින පැවති නිවාස හා ප්‍රජා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.09.02 වන දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.09.02 වන දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

**(උ) වෙනත් කරුණු**

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතාගේ අදහස් දැක්වීම</u>

යෝධකණ්ඩිය දේවානන්ද මහා විද්‍යාලේ පන්ති කාමරයන්හි ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා අප ප්‍රදේශයේ දරුවන් දෙදෙනෙක් බෙරලිහෙල ප්‍රදේශයේ පාසලක අධ්‍යාපන කටයුතු සිදු කරනු ලබයි. මේ දිනවල පවතින ඉන්ධන ගැටලුවත් සමඟ බෙරලිහෙල වැනි දුර ප්‍රදේශයක එම දරුවන්

දෙදෙනා රැගෙන යාමට එම දරුවන්ගේ පියාට නොහැකි වීම නිසා දරුවන් දෙදෙනාට මාස 03 ක් තිස්සේ නිවසේ රැදී සිටීමට සිදුව ඇත. නිවස ළඟ පාසලක් තිබියදීත් එම දරුවන් දෙදෙනාට එකී පාසල සඳහා ඇතුළත් වීම නොහැකි වීමෙන් ඔවුන් දැඩි අසරණකමකට පත්ව ඇත. එම නිසා මෙකී කරුණ සම්බන්ධයෙන් සානුකම්පිතව සිතා, දැඩි අවධානය යොමු කර මෙම දරුවන් දෙදෙනා හට සාධාරණයක් ඉටු කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, වැල්ලගේ ජීවානි මහතා</u>

යෝධකණ්ඩිය විදුහලේ 01 ශ්‍රේණිය සඳහා පන්ති කාමර 03 ක් පවතින බැවින්, එකී පන්ති කාමර 03 ට ප්‍රමාණවත් වන පරිදි අයදුම්කර ළමුන් ඇතුළත් කර ගනු ලබයි. නමුත් මේ වන විට මෙකී විදුහල ජාතික පාසලක් බවට පත් කර ඇති නිසාත්, ඒ අවට නව ගම්මාන රැසක් බිහි වී ඇති නිසාත් තවත් පන්ති කාමරයක් වැඩි කර, අනෙක් ළමුන්ද ඇතුළත් කර ගැනීමට කටයුතු සිදු කරන ලෙසට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකතුමියට යොමු කරන ලද ලිපියට ඇතුලත් කරන ලෙසත්, මේ සම්බන්ධයෙන් මීන් පෙරද යෝජනා ඉදිරිපත් කර ඇති බවට එකී ලිපියට ඇතුලත් කරන ලෙසට දන්වා සිටින ලදී.

එසේම පාසලක් සඳහා යම් ළමයකු ඇතුළත් කර ගැනීමේ දී ඒ සඳහා නිර්ණායක කිහිපයක් සොයා බලනු ලබයි. එම නිර්ණායකවලින් 01 ක් හෝ නොතිබුණහොත්, පාසල ළඟ සිටින ළමයකුට හෝ එකී පාසලට ඇතුලත් විය නොහැකි බවත් දන්වා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>අධ්‍යාපන අමාත්‍යාංශය මගින් එක් පන්ති කාමරයක් සඳහා ළමුන් 40 ක් පමණක් ඇතුළත් කර ගන්නා ලෙසට චක්‍රලේඛයක් නිකුත් කර තිබියදී, එම චක්‍රලේඛයට පිටතින් ළමුන් ඇතුලත් කර ගැනීමට විදුහල්පතිතුමාට කිසිදු හැකියාවක් නොමැත. එම නිසා මේ සම්බන්ධයෙන් පවතින සත්‍යතාවය දන්වා එම දරුවන් දෙදෙනා යෝධකණ්ඩිය දේවානන්ද මහා විදුහලට ඇතුළත් කර ගැනීමට හැකියාව පවතින්නේ ද යන්න පිළිබදව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකතුමියට ලිපියක් යොමු කිරීමට තීරණය විය.</u>

<u>එසේම යෝධකණ්ඩිය විදුහල අසල සිටියදීත් බෙරලිහෙල විදුහලේ 03 සහ 05 ශ්‍රේණියට අධ්‍යාපනය සඳහා යාමට සිදුව ඇති යෝධකණ්ඩිය ප්‍රදේශයේ අසරණ වී ඇති ළමුන් දෙදෙනා සම්බන්ධයෙන් සාධාරණයක් ඉටු කර ගැනීමට සහ යෝධකණ්ඩිය අවට නව ගම්මාන රැසක් බිහි වීම මත එහි පාසල් යන දරුවන් වැඩි ප්‍රමාණයක් සිටින බැවින්, යෝධකණ්ඩිය විදුහල සඳහා 01 ශ්‍රේණියට තවත් එක් පන්තියක් ඇතුළත් කර ගැනීම යන කරුණු දෙක ඇතුළත් කර ඒ සඳහා විසදුමක් ලබා දෙන ලෙසට අධ්‍යාපන ලේකම්තුමාට දන්වා යැවීම සුදුසු බවත් ප්‍රකාශ කර සිටින ලදී.</u>

<u>තවද, ඉහතින් සඳහන් කරන ලද කරුණ පිළිබදවත්, ප්‍රදේශයේ පාසල් සඳහා ළමුන් බදවා ගැනීමේ දී සලකා බලනු ලබන නිර්ණායකයන් නිසා පාසල අසල සිටින ළමුන්ටත් ළඟම පාසලට ඇතුළත් වීමට නොහැකිව පත්ව ඇති අසරණතාවය සම්බන්ධයෙන් සාකච්ඡා කර විසදුමක් ලබා ගැනීම සඳහා කමිටුවක් පත් කිරීම සුදුසු බැවින්, එම කමිටුව සඳහා ගරු උප සභාපතිතුමා, ගරු සභික ආර්.කේ.එම්. රෝහිත මහතා, චතුමිණි විජේනායක මෙනවිය, වැල්ලගේ ජීවානි මහත්මිය, පී.කේ. ආරියසේන මහතා, ඒ.පී. ධම්මික මහතා, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා, ඩබ්.කේ. ටෂිත සමිල මහතා ඇතුළු ප්‍රධාන පාසල්වල විදුහල්පතිවරු සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ලෙස ඉදිරියේ දී ගරු චමල් රාජපක්ෂ මැතිතුමා වැඩ භාර ගැනීමට නියමිත බැවින්, ගරු එතුමන්ගේ නියෝජිතයෙක්ද මේ සඳහා ගෙන්වා ගැනීමට කටයුතු කර මේ සඳහා ස්ථිරසාර විසදුමක් ලබා ගැනීම සුදුසු බවට තීරණය විය. එකී සාකච්ඡාවෙන් ලැබෙන තීරණයත්, යෝධකණ්ඩිය ප්‍රදේශයේ නව ගම්මාන රැසක් බිහි වීම මත පාසල් යන දූරවන් බොහොමයක් සිටින බැවින්, යෝධකණ්ඩිය විදුහල අවට තිබෙන ගම්මානවල ළමුන් කොපමන ප්‍රමාණයක් සිටීද යන්නත් තොරතුරු ලබා ගෙන, ඒ සම්බන්ධයෙන් සාධාරණීකරණ වාර්තාවක් සකස් කර ගරු ආණ්ඩුකාරතුමා වෙත දන්වා යැවීමට කටයුතු සිදු කරන ලෙසට ප්‍රජා සංවර්ධන නිලධාරීට උපදෙස් ලබා දෙන ලදී.</u>

කිරින්ද ප්‍රදේශයේ පිහිටා ඇති ප්‍රජා ශාලාව අසල තිබෙන පෙර පාසලෙහි ඉගනුම ලබන ළමුන් සඳහා සෙල්ලම් කිරීමට එම ස්ථානයේ තිබෙන බෝ කොටුව සඳහා මුහුදු වැලි යම් ප්‍රමාණයක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

කිරින්ද රථවාහන නැවතුම්පොළ ගාස්තු අය කිරීම අප ආයතනයෙන් ටෙන්ඩරය ලබා ගෙන සිදු කරන බවට ජනතාව දැනුවත්භාවයක් නොමැති බැවින්, එලෙසට ගාස්තු අය කරන පුද්ගලයාට අප ආයතනය මගින් නිල ඇඳුමක් ලබා දීම සුදුසු බව දන්වා සිටින ලදී.

යාල පාරේ එළිෆන්ට් රීච් හෝටලය ඉදිරිපිට කට්ටාඩි වැව පාර පහල භූමි කොටස ක්‍රීඩාපිටියක් සඳහා වෙන් කර ඇති බැවින්, එකී ක්‍රීඩාපිටිය ක්‍රීඩා කිරීමට හැකි පරිදි නඩත්තු කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

රටේ පවතින ඇතැම් අර්බුදකාරී තත්ත්වයන් හමුවේ මේ දිනවල සංවර්ධන කටයුතු සිදු කිරීම නතර කර තිබුණද, කොට්ඨාසයන්හි ගමන් කිරීමට නොහැකි තත්ත්වයේ පවතින මාර්ග කිහිපයක් තිබෙන බැවින්, හැකි නම් ඉහල දේශපාලන අධිකාරියේ ප්‍රතිපාදන ලබා ගනිමින් හෝ එම මාර්ග බොරලු යොදා සංවර්ධනය කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>යම් භූමි ප්‍රමාණයක් ක්‍රීඩාපිටියක් සඳහා වෙන් කර ඇත්නම්, එකී ක්‍රීඩාපිටියට අදාළ නඩත්තු කටයුතු අප ආයතනය සතු වේ. එම නිසා යාල පාරේ එළිෆන්ට් රීච් හෝටලය ඉදිරිපිට කට්ටාඩි වැව පාර පහල පිහිටි භූමි ප්‍රමාණය ක්‍රීඩාපිටියක් ලෙස නම් කර තිබේ නම්, එය අප ආයතනය වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසට ප්‍රාදේශීය ලේකම්තුමිය වෙත දන්වා යැවීමට තීරණය විය.</u>

<u>ඉදිරියේ දී අප සභාව සතු දේපල ටෙන්ඩර් ලබා දීමේදී, ගාස්තු අය කිරීම් සිදු කරනු ලබන දේපළ සඳහා අප ආයතනය විසින් නිල ඇඳුමක් ලබා දීම සුදුසු වන බැවින්, එකී නිල ඇඳුමට යන ගාස්තුව ද ඇතුළත් කර අදාළ ටෙන්ඩර් මුදල තීරණය කිරීම සුදුසු බවට තීරණය විය.</u>

<u>රටේ පවතින ආර්ථික තත්ත්වයන් හමුවේ අතිගරු ජනාධිපතිතුමා විසින් චක්‍රලේඛයක් නිකුත් කර සංවර්ධන කටයුතු සිදු නොකරන ලෙසට දන්වා ඇති බැවින්, හැකි පමණින් ගමේ ශ්‍රම දායකත්වය ලබා ගෙන මාර්ග නඩත්තු කර ගන්නා ලෙසටත්, එලෙසට සිදු කරනන්නා වූ සේවාවන් සඳහා ප්‍රාදේශීය සභාවේ හැකි පමණින් දායකත්වයක් ලබා දීමට හැකි බවත් දන්වා සිටින ලදී.</u>

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතාගේ අදහස් දැක්වීම</u>

උඩුවිල සිගිති අසපුව පෙර පාසල් භූමියේ ගේට්ටුව ළඟ සිට පෙර පාසල් ගොඩනැගිල්ලට පිවිසෙන මාර්ගයේ අතුරා ඇති ගල් කැඩී ඇති බැවින්, මෙය සකස් කර දෙන ලෙසට එම පෙර පාසලේ දරුවන්ගේ දෙමාපියන් විසින් ඉල්ලීම් කළ බැවින්, මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

කොට්ඨාසයේ විදී පහන් කිහිපයක් අක්‍රීය වී ඇති බැවින්, එම විදී පහන් නඩත්තු කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

මීට පෙර අවස්ථාවල තම කොට්ඨාසයේ මාර්ග සංවර්ධන කටයුතු සිදු කර දීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරන ලදී. එසේම බොරලු මාර්ගයක් ලෙස පවතින රබර්වත්ත පහල පාදිලිගම පාර ගමන් කිරීමට නොහැකි ලෙස අබලන් තත්ත්වයට පත්ව ඇති බැවින්, හැකියාවක් පවතින්නේ නම් එම මාර්ගය සකස් කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

යම් විථි පහනක් අක්‍රීය වී ඇත්නම්, එකී විථි පහන සවි කර ඇති ස්ථාන සමඟ ලේඛනයක් ලබා දෙන ලෙසට සියලුම ගරු සභිකයින් වෙත දන්වා සිටින ලදී. බොහෝ අවස්ථාවල විථි පහන් අක්‍රීය වීමට හේතුවක් වන්නේ විථි පහන් නිමා දැමීමට කටයුතු සිදු නොකිරීමයි. ඉදිරියේ දී විථි පහනක් දැල්වෙන මුළු කාල සීමාව සොයා බැලීමක් සිදු කර, කාල සීමාව අවසන් වීමෙන් අක්‍රීය වී ඇත්නම් පමණක් විථි පහන් සවි කිරීමට කටයුතු සිදු කරන බවත්, එසේ නොමැති නම් සවි කිරීම් සිදු නොකරන බවත් දන්වා සිටින ලදී.

මන්ත්‍රී කොට්ඨාසයන්හි සත්‍ය සාධාරණ වශයෙන්ම ගමන් කිරීමට නොහැකි දැඩි අබලන් තත්ත්වයේ පවතින මාර්ග පමණක් තිබේ නම්, එකී මාර්ග නාම ලේඛනයක් ලබා දෙන ලෙසටත්, ඉන් පසුව තාක්ෂණ සේවා නිලධාරී වාර්තා ලබා ගෙන එකී මාර්ග සකස් කිරීමට හැකියාව පවතින්නේ ද යන්න අනුමැතියක් ගරු ආණ්ඩුකාරතුමා වෙතින් ලබා ගත හැකි බව ප්‍රකාශ කර සිටින ලදී.

එසේම මාර්ග සකස් කිරීමේදී ප්‍රථමයෙන් ගරු සභික ආර්.කේ.එම්. රෝහිත මහතාගේ සහ එන්.ජී. සරත් මහතාගේ කොට්ඨාසයන්හි පවතින දැඩි අබලන් තත්ත්වයේ පවතින මාර්ග සම්බන්ධයෙන් වාර්තාවක් තාක්ෂණ සේවා නිලධාරී වෙතින් ලබා ගැනීමට තීරණය විය.

❖ ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය අදහස් දැක්වීම

කාන්තා මහජන නියෝජිතයින් සේ අප සභාව නියෝජන කළද, කාන්තාවන් හා ළමුන් වෙනුවෙන් මේ දක්වා කිසිදු වැඩසටහනක් සිදු කිරීමට අපට නොහැකි වී ඇත. කාන්තා හා ළමා හිංසනය පිළිබද වැඩසටහනක් සිදු කිරීම ඉතාමත් අත්‍යාවශ්‍ය කරුණකි. කාන්තා හිංසනය, ළමා අපචාර වැඩි වශයෙන් අප ප්‍රදේශය පුරාද පවතිනු ඇත. වර්තමානය වන විට ජංගම දුරකතන නිසා ළමුන් බොහොමයක් විනාශවීමට ඉඩකඩ සැලසී ඇත. එම නිසා වැඩසටහනක් සංවිධානය කර ගැනීමට හැකි නම් මේ සම්බන්ධයෙන් දෙමාපියන් දැනුවත් කිරීමට හැකි වන බව ප්‍රකාශ කර සිටින ලදී.

මහජන නියෝජිතයින් සේ අප සැම අවස්ථාවකම ජනතාව වෙනුවෙන් සේවය සිදු කිරීමේදී කාන්තා හිංසනය හා ළමා අපචාර පිළිබදව දැඩි අවධානයෙන් යුතුව සිතා අනිවාරයෙන්ම යම් වැඩසටහනක් සිදු කළ යුතු බවත්, මෙකී වැඩසටහන් සිදු කිරීමේ දී කාන්තාවන් සහ පිරිමි යන දෙපාර්ශවයම ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු බවත් දන්වා සිටින ලදී.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

ළමා අපචාර, කාන්තා හිංසනය පිළිබද වැඩසටහනක් ගමේ පවතින ප්‍රජා කමිටුව හරහා සිදු කිරීමට හැකියාව පවතින බැවින්, මේ සම්බන්ධයෙන් ගරු සභිකයින්ද සම්බන්ධ කර ගනිමින් වැඩසටහනක් සංවිධානය කිරීම සුදුසු වන බවත්, එකී වැඩසටහන සඳහා රාජ්‍ය නොවන සංවිධානවලින් සම්පත් දායකත්වය ලබා ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී. එසේම තිස්සමහාරාම පොලිස් ස්ථානයේ කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිතුමිය වෙත මෙවැනි ගැටළු දස දහස් ගනණින් ඉදිරිපත් වන බැවින්, මේ සම්බන්ධයෙන් වේදිකාවක් සැකසුනහොත්, පිරිමි කාන්තා යන දෙපාර්ශවයටම දැනුවත්වීමක් සිදු කිරීමට එතුමියට හැකි බව මා වෙත දන්වා ඇති බැවින්, මෙම වැඩසටහන සඳහා එතුමියද සම්බන්ධ කර ගත හැකි බව ප්‍රකාශ කරන ලදී.

ළමා අපචාර, කාන්තා හිංසනය පිළිබද වැඩසටහනක් සංවිධානය කිරීමට පෙර ප්‍රාදේශීය ලේකම්තුමිය, පොලිස් ස්ථානයන්හි ස්ථානාධිපති 03 දෙනා, ගරු උප සභාපති සුදත් විදානගමගේ මහතා, ගරු සභික, චතුමිණි විජේනායක මෙනවිය, වැල්ලගේ ජීවානි මිය, ඩබ්.කේ.කේ. ශාන්තිලතා මිය, ඒ.ඩබ්. නන්දා මිය, ජී.එච්.ටී. නීටා මිය, ඩබ්.කේ. ටෂිත සමිල මහතා, පී.කේ. ආරියසේන මහතා, ආර්.කේ.එම්. රෝහිත මහතා, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වනිතා නිලධාරී සහ පරිවාස

නිලධාරී ආදිය එක්ව ප්‍රථමයෙන් සාකච්ඡාවක් ලබා ගෙන මේ සම්බන්ධව වැඩසටහනක් සංවිධානය කිරීම සම්බන්ධ තීරණයක් ලබා ගැනීම සුදුසු වන බැවින්, එකී කමිටුව රැස් කිරීමට ප්‍රජා සංවර්ධන නිලධාරී වෙත උපදෙස් ලබා දෙන ලදී.

❖ **ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම**

ගරු සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා විසින් ආයතනයේ නිලධාරිනියක් වෙතින් ටෙන්ඩර් දේපළ සම්බන්ධයෙන් යම් තොරතුරු විමසීමක් සිදු කර ඇත. එලෙසට යම් තොරතුරක් දැන ගැනීමේ අවශ්‍යතාවයක් පවතින්නේ නම් වාචිකව විමසීම් සිදු නොකර, මහා සභා අවස්ථාවේ යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න යටතේ සහ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉල්ලීම් කළ පසුව දැන ගැනීමට හැකිව පවතින බවත්, එසේ නැතහොත් මේ අවස්ථාවේ කාරක සභා අවස්ථාවක් කර, අවශ්‍ය තොරතුරු දැන ගැනීමට හැකි බවත් දන්වා සිටින ලදී.

අප සභාවේ ඉටු කරනු ලබන සෑම කාර්යයක්ම නිවැරදිව විනිවිදභාවයෙන් යුතුව සිදු කර ගෙන යාමට කටයුතු කරන බවත්, එකී සෑම කාර්යයක්ම එලෙස සිදු කිරීමට සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු සභිකයින් සියලුම දෙනාටත්, ලේකම්තුමිය ඇතුලු සියලුම නිලධාරීන්ට ස්තුතිය පුද කරන ලදී.

ඉදිරියේ අප සභාවෙන් ලබා දෙන සියලුම සේවාවන්, ආදායම් අය කර ගැනීම් අන්තර්ජාලය හරහා සිදු කිරීමට වැඩපිළිවෙලක් සකස් කිරීමට අපේක්ෂා කරන අතර, අප ආයතනයෙන් ලබා දෙන සේවාවන් පිළිබඳ ජනතාව දැනුවත් වීම සඳහා තිස්සමහාරාම ප්‍රාදේශීය සභා වෙබ් අඩවිය වෙත මුදා හැරීමට කටයුතු කරන බවටත් දන්වා සිටින ලදී.

මහා පරිමාණ හෝටල්වලින් ඉවත් කරනු ලබන ආහාර සකස් කිරීම සඳහා භාවිතා කරනු ලබන තෙල් වර්ග වෙළඳසැල්වල අලෙවි කිරීමට සඳහා තිබෙන බවට කරුණු දැන ගැනීමට ලැබී ඇත. මෙකී තෙල් භාවිතා කිරීමෙන් පිළිකා කාරක රෝග වැලදීමට ඉඩ පවතින බැවින්, මේ සම්බන්ධයෙන් අවධානයෙන් සිට ආහාර භාවිතයට ගැනීම සඳහා භාවිතා කරන තෙල් වලින් ඇතිවිය හැකි සෞඛ්‍ය ගැටළුව වළක්වා ගැනීමට අප සියලුම දෙනා එක්ව කටයුතු කළ යුතුය.

එසේම මේ දිනවල කරවල වේලීම සඳහා පෙට්‍රල්, ඩීසල් යොදා ගැනීමට කටයුතු කරන බවට කරුණු දැන ගැනීමට ලැබී ඇති බැවින්, මේ සම්බන්ධයෙන්ද අවධානය යොමු කර මේ සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලෙසට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත සහ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙත දන්වා යැවීම සුදුසු වන බවත් දන්වා සිටින ලදී.

බල ප්‍රදේශය තුළ වැඩි වශයෙන් අනවසර ඉදිකිරීම් සිදු කරනු ලබන අතර, පදික වේදිකාවේ ද එලෙස අනවසර වෙළදාම් සිදු කරනු ලබයි. එම නිසා මෙලෙසට පවතින අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් සොයා බලා වාර්තාවක් ලබා දෙන ලෙසට නාගරික සංවර්ධන අධිකාරියට සහ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යැවිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

නගරයේ සේම ගම්මානවලද යම් සැලසුමක් යම් ඉදිකිරීමක් සිදු කරන්නේ නම්, එකී සැලසුම ප්‍රාදේශීය සභාවේ අනුමත කර ගත යුතු බවට කොට්ඨාස ගරු සභිකයින් මගින් ගමේ ජනතාව දැනුවත් කරන ලෙසට දන්වා සිටින ලදී.

කොට්ඨාස 13 සඳහා මේ වන විට ප්‍රජා කමිටු 06 ක් පිහිටුවා ඇති අතර, ඉතිරි කොට්ඨාසයන් සඳහා ද ප්‍රජා කමිටු කඩිනමින් පිහිටුවීමට කටයුතු කරන බවත්, මෙම ප්‍රජා කමිටු සියල්ල පිටුවා ගත් පසුව, අප කාලය අවසන් වුවත් ප්‍රජා කමිටු හරහා ප්‍රාදේශීය සභාවයි ගමයි සම්බන්ධ වී ජනතාවට කටයුතු කළ හැකි බව ප්‍රකාශ කර සිටින ලදී.

✓ ඉදිරියේ පිහිටුවීමට නියමිත ප්‍රජා කමිටු පිළිබඳ තොරතුරු දැන ගැනීම සඳහා ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

මහා සභාවට කැඳවූ ප්‍රජා සංවර්ධන නිලධාරී ටී.එච්. සචිත්‍රා ප්‍රසාදනී මහත්මිය විසින් ප්‍රකාශ කරන ලද්දේ මා ප්‍රජා සංවර්ධන නිලධාරී විෂයේ රාජකාරී භාර ගෙන කෙටි කාලයක් වන බවත්, ඒ වන විට දෙබරවැව කොට්ඨාසය සඳහා ලයන් ප්‍රජා කමිටුවද, පන්නෙගමුවකොට්ඨාසය සඳහා අරුණළු ප්‍රජා කමිටුවද, නැදිගම්විල කොට්ඨාසය සඳහා නැදිගම්විල නෙලුම් ප්‍රජා කමිටුවද, රණකෙළිය කොට්ඨාසය සඳහා විහාරමහාදේවී ප්‍රජා කමිටුවද, තිස්සපුර කොට්ඨාසය සඳහා ශක්ති ප්‍රජා කමිටුවද, මහසෙන්පුර කොට්ඨාසය සඳහා මහසෙන් ප්‍රජා කමිටුව ද යන ප්‍රජා කමිටු 06 ක් පිහිටුවා ලියාපදිංචි කර ඇති බවත්, ඉතිරි කොට්ඨාස සඳහා වන ප්‍රජා කමිටු පිහිටුවීමට අදාළ කටයුතු ඉදිරියේ දී සිදු කිරීමට කටයුතු කළ හැකි බවයි.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>අනෙක් කොට්ඨාසයන් සඳහා ද ප්‍රජා කමිටු කඩිනමින් පිහිටුවීමට කටයුතු කරන ලෙසට ප්‍රජා සංවර්ධන නිලධාරී වෙත උපදෙස් ලබා දෙන ලදී.</u>

✓ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ ආර්.ජී. ගයාන් සඳරුවන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් කරන ලදී.

ප්‍රාදේශීය සභාවේ හිටපු ගරු සභාපතිවරු, ගරු උප සභාපතිවරු සහ ගරු සභිකයින්ගේ සහ දැනට සිටින මහජන නියෝජිතයින් 23 දෙනාගේ ඡයා රූප යම් අයෙකුට දැක බලා ගැනීම සඳහා කිසිදු ස්ථානයක නොමැති බැවින්, අප සභාව විසින් එළි දැක්වීමට නියමිත ''මාගම්පත්තු පුරාණය 02'' කෘතිය සඳහා එකී ඡායාරූප ඇතුළත් කිරීම සුදුසු වන බවට යෝජනා කරන ලදී.

ජනතාව වෙනුවෙන් පෙනී සිට ජනතාවට සේවයක් ඉටු කර දීම සඳහා මහා සභාව නියෝජනය කරමින් අදහස් දැක්වීම්, යෝජනා ලබා දෙමින්, අද දින ඉතාමත් වගකීමෙන් යුක්තව නීත්‍යානුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් ගරු උප සභාපතිතමා ඇතුළු ගරු සභිකයින් සියලුම දෙනා වෙත ස්තූතිය පුද කරන ලදී. මහා සභාව තුළ දේශපාලන වශයෙන් කොට්ඨාස 04 ක් නියෝජනය වන පරිදි මහජන නියෝජිතයින් සිටියද, පාට පක්ෂ භේද නොබලා අප සියලුම දෙනා එක්ව ජනතාව වෙනුවෙන් කටයුතු කළ යුතු බව ප්‍රකාශ කර සිටින ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්ට හා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත්, ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ස්තූතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව. 02.15 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

2022 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයට පැවැත්වීමට නියමිත මාසික මහා සභාව, 2022 මාසික මහා සභා රැස්වීම් කාල සටහනේ සඳහන් පරිදි 2022.10.18 වන දින පැවැත්වීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

වාර්තා කළේ - ඩී. රුවිනා දීපානි,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

සභාපති,
ඩබ්ලිව්.ජී. උපුල්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2022.09.16 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.